ගරුභාණ්ඩ විනිච්ඡය

සෝමරත්න කුරේ ධර්මදාන පුස්තක පඞ්ක්තිය. අඞ්ක 3.

ගරුභණ්ඩ විනිච්ඡය.

විද්‍යෝදය පිරිවෙණේ

ආචාර්ය්‍ය කළුකොඳයාවේ පඤ්ඤාසේඛර

ස්ථවිරපාදයන්වහන්සේ

විසින්

සම්පාදිත යි.

කොළඹ දෙමටගොඩ ප්ලේස්හි

ඒ. පී. සෝමරත්න කුරේ

විසින්

කාලයාත්‍රා කළ ස්වකීය නෝනා මහත්මයාට

පින් පැමිණවීම සඳහා පූජා කිරීම පිණිස

විද්‍යාසාගර මුද්‍රණාලයෙහි මුද්‍රණය කරණලදී.

2433
1939

(පිටපත් 3000)

සෝමරත්න කුරේ ධර්මදූත පුස්තක පඞ්ක්තිය. අඞ්ක 3.

ගරුභණ්ඩ විනිච්ඡය.

විද්‍යොදය පිරිවෙණෙ

ආචාර්ය්‍ය කලුකොඳයාවේ පඤ්ඤාසෙඛර

ස්ථවිරපාදයන්වහන්සේ

විසින්

සම්පාදිත යි.

කොළඹ දෙමටගොඩ ප්ලේස්හි

ඒ. පී. සෝමරත්න කුරේ

විසින්

කාලයාත්‍රා කළ ස්වකීය නෝනා මහත්මයාට

පින් පැමිණවීම සඳහා පූජා කිරීම පිණිස

විද්‍යාසාගර මුද්‍රණාලයෙහි මුද්‍රණය කරණලදී.

2433

1939

සංඥාපනය.

ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සඞ්ඝසභාව පිළිබඳ කාරක සභා රැස්වීම් වාරයක් පාසා ම ස්වනිකායට අයත් භික්ෂූන්ගේ විනයානුකූල පැවැත්ම ද විනයධර්මයෙහි විශිෂ්ට ඥානය ද ඇති කරවීම අපේක්ෂා කොට විනයධර ස්ථවිර නමක් විසින් කථාවක් පවත්වනු ලැබේ.

එයට අනු ව "ගරුභණ්ඩවිනිච්ඡය" පිළිබඳ ව විනය කථාවක් කිරීමට මට පැවරුනේ ය. එහෙයින් 1931 සැප්තැම්බර් මස 19 වන දින බොරලැස්ගමුවේ පරමධම්මනිවෙස පරිවෙණස්ථානයෙහි ද 1932 ජූලි මස 3 වන දින නාවගමුවේ සුගතබිම්බාරාම පුරාණ විහාරස්ථානයෙහි ද පවත්වනු ලැබූ කාරකසභා රැස්වීම් වාරයන්හි දී මාගේ කථාව කෙළෙමි. "එය තව මඳක් විස්තර සහිතව මුද්‍රණය කරවා ප්‍රචාරයට පැමිණවුවහොත් මැනවැ" යි රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණේ උපප්‍රධානාචාර්‍ය්‍ය වලානේ සටඞ්ඝිස්සර ස්ථවිරයෝ එතෙණෙහි ම ආරාධනය කළහ. නිකායයේ සඞ්ඝනායක ධුරන්ධර අඟලවත්තේ ප්‍රතිරාජ පරිවෙණාධිපති පිඹුරේ සිරි ධම්මානන්ද වාචිස්සර ස්වාමීන්ද්‍රයන්වහන්සේ ඇතුළු හැම කාරක සභ්‍යයන්වහන්සේ ම ඒ අදහස අනුමත කළහ. එහෙයින් මම එය පොතක් වශයෙන් සම්පාදනය කෙළෙමි. එහෙත් එය මුද්‍රණය කරවීම සඳහා ශ්‍රද්ධාවත් භවතෙකු සොයා ගැණීමට ටික කලක් ගත විය.

ඒ අතර වර්ෂයක් පාසා ම ස්වකීය ධනව්‍යයයෙන් ධර්මපුස්තක මුද්‍රණය කරවා නොමිලයේ බෙදා දෙන කොළඹ විද්‍යාසාගර මුද්‍රණ යන්ත්‍රාලයාධිපති ඒ. පී. සෝමරත්න කුරේ මහත්මයාට මාගේ අදහස දැන්වූ කෙණෙහි ම ඒ මහත්මයා ඉතා කැමැත්තෙන් එයට එකඟ විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙය භික්ෂූන්වහන්සේ අතට පැමිණවීමට මට හැකි වූයේ ය. එහෙයින් මෙය කියවා ප්‍රයෝජන ගන්නා හැම භික්ෂූන්වහන්සේගේ ම කෘතඥභාවය ඒ ශ්‍රද්ධාවත් මහත්මයාට හිමි විය යුතු ය.

පිටු ගණනින් මහත් සංඛ්‍යාවක් නු වූව ද මෙය සම්පාදනය කිරීමේ දී ප්‍රමාණවත් පරිශ්‍රමයක් දරන්නට සිදු විය. මේ සඳහා 1 චූලවග්ග පාලි, 2 පරිවාර පාලි, 3 විනයාලඞ්කාර, 4 සිඛවළඳ, 5 සික්ඛාපදවලඤ්ජන, 6 සිඛවළඳ විනිස, 7 මූළසික, 8 මූළසික සන්න, 9 කඞ්ඛාවිතරණී ගැටපද, 10 ඛුද්දසික්ඛා ටීකා,

12 කුද්‍රසික සන්න, 13 සමන්තපාසාදිකා, 14 සාරත්ථදීපනී ටීකා, 16 කඞ්ඛාවිතරණී පිටපොත, 16 විනයසඞ්ගහ අත්ථවණ්ණනා, 17 විනයවිනිච්ඡය, 18 විනයවිනිච්ඡය ටීකා, 19 ධම්මපදට්ඨකථා, 20 සද්ධර්මරත්නාවලි, 21 පපඤ්චසූදනි, 22 අමාවතුර, 23 ධර්ම පියා ගැටපදය, 24 බුත්සරණ, 25 පන්සියපණස්ජාතකපොත, 26 කඞ්ඛාවිතරණී, 27 විනයත්ථමඤ්ජූසා, 28 පාලිමුත්තකවිනය විනිච්ඡය, 29 විමතිවිනෝදනී ටීකා, 30 වජ්‍රබුද්ධි ටීකා, 31 පාලි මුත්තකවිනයවිනිච්ඡය ටීකා යන ග්‍රන්ථයන්ගෙන් කරුණු උපුටා ගතිමි.

සාඞ්ඝිකපරිභොගයෙන් ප්‍රයොජන ගතයුතු බොහෝ බඩු, නො දැනිම හෙතු කොට ගෙණ පෞද්ගලිකපරිභොගයට ගැණී මෙන් වරද සිදු කර ගන්නා භික්ෂූන්වහන්සේ ස්වල්ප නො වෙති. උන්වහන්සේ අතුරෙන් එක් නමකගේ වත් ශ්‍රමණ භාවය ආරක්ෂා වීමට මෙය උපකාර වුවහොත් එය ම මාගේ උත්සාහයට සරි ලන ප්‍රතිඵලය කොට මම සලකමි.

ස්වකීය ප්‍රියභාර්‍ය්‍යාවට අනුමෝදන් කරවීම පිණිස එයට වඩා මහත් පිණක් සිදු කර ගැණීම සෝමරත්න කුරේ මහත්මයාට ද පහසු නො වේ ය යි සිතමි.

හුදු බුද්ධශාසනාභිවෘද්ධිය ම අපෙක්ෂා කොට මේ ග්‍රන්ථය සැපයීමෙන් මා රැස් කර ගත් කුශලචේතනාරාශිය මාගේ ප්‍රව්‍රජ්‍යාචාර්‍ය්‍ය වූ කඩුවාවල සුමනතිස්සාභිධාන මහා ස්වාමිපාදයන් වහන්සේට ද ධර්මවිනයාචාර්‍ය්‍ය වූ මහගොඩ ශ්‍රී ඥානෙශ්වර, කහවෙ ශ්‍රී රතනසාර නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේලාට ද ස්වර්ග මොක්ෂ ප්‍රතිලාභය පිණිස ගුරුපූජා වශයෙන් පූජා වේවා.

මෙයට,

කළුකොඳයාවේ ප්‍රඥාසෙඛර

ස්ථවිරයෙමි.

ශ්‍රී බුද්ධ වර්ෂ 2483 අධි නිකිනි මස
අව අටවක දින විද්‍යෝදය
පිරිවෙණෙහි දී ය.

ගරුභණ්ඩ විනිච්ඡය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

"තෙන ඛො පන සමයෙන **සාවත්ථියා** අවිදූරෙ අඤ්ඤතරස්මිං ගාමකාවාසෙ ආවාසිකා භික්ඛූ උපද්දුතා හොන්ති ආගන්තුකගමිකානං භික්ඛූනං සෙනාසනං පඤ්ඤපෙන්තා. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "එතරහි ඛො මයං ආවුසො උපද්දුතා ආගන්තුකගමිකානං භික්ඛූනං සෙනාසනං පඤ්ඤපෙන්තා හන්ද මයං ආවුසො සබ්බං සඞ්ඝිකං සෙනාසනං එකස්ස දෙම. තස්ස සන්තිකං පරිභුඤ්ජිස්සාමා" ති. තෙ සබ්බං සඞ්ඝිකං සෙනාසනං එකස්ස අදංසු. ආගන්තුකා භික්ඛූ තෙ භික්ඛූ එතදවොචුං: "අම්හාකං ආවුසො සෙනාසනං පඤ්ඤපෙථා" ති. "නත්ථාවුසො සඞ්ඝිකං සෙනාසනං. සබ්බං අම්හෙහි එකස්ස දින්නං" ති "කිං පන තුම්හෙ ආවුසො සඞ්ඝිකං සෙනාසනං විස්සජ්ජෙථා" ති. "එවමාවුසො" ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ සඞ්ඝිකං සෙනාසනං විස්සජ්ජෙන්තී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ සඞ්ඝිකං සෙනාසනං විස්සජ්ජෙන්තී" ති. "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා සඞ්ඝිකං සෙනාසනං විස්සජ්ජෙස්සන්ති? නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය, පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං මොඝපුරිසා අප්පසන්නානඤ්චෙව අප්පසාදාය, පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා" ති. අථ ඛො භගවා තෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"පඤ්චිමානි භික්ඛවෙ අවිස්සජ්ජියානි න විස්සජ්ජෙතබ්බානි සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විස්සජ්ජිතානිපි අවිස්සජ්ජිතානි හොන්ති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස. කතමානි පඤ්ච? ආරාමො, ආරාමවත්ථු. ඉදං පඨමං අවිස්සජ්ජියං න විස්සජ්ජෙතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විස්සජ්ජිතම්පි අවිස්සජ්ජිතං හොති. යො විස්සජ්ජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස. විහාරො විහාරවත්ථු. ඉදං දුතියං අවිස්සජ්ජියං - පෙ·

ථුලලචචයසස. මඤචො, පීඨං, භිසි, බිමබොහනං. ඉදං තතියං අවිසසජජියං – පෙ – ථුලලචචයසස. ලොහකුමභී, ලොහභාණකං, ලොහවාරකො, ලොහකටාහං, වාසි, ඵරසු, කුඨාරි, කුදාලො, නිඛාදනං. ඉදං චතුතථං අවිසසජජියං – පෙ – ථුලලචචයසස. වලලි, වෙළු, මුඤජං, බබබජං, තිණං, මතතිකා, දාරුභණඩං, මතතිකාභණඩං. ඉදං පඤචමං අවිසසජජියං න විසසජෙජතබබං සඞෙඝන වා ගණෙන වා පුගගලෙන වා. විසසජජිතමපි අවිසසජජිතං හොති. යො විසසජෙජයය ආපතති ථුලලචචයසස. ඉමානි ඛො භිකඛවෙ පඤච අවිසසජජියානි න විසසජෙජතබබානි සඞෙඝන වා ගණෙන වා පුගගලෙන වා. විසසජජිතානිපි අවිසසජජිතානි හොනති. යො විසසජෙජයය ආපතති ථුලලචචයසසා " ති.

චුලලවගගපාළි - සෙනාසනකඛනධක.

එසමයෙහි වනාහි සැවැත් නුවරට නුදුරුතැන එක්තරා ග්‍රාමකාවාසයෙක්හි ආවාසික භික්ෂූහු ආගන්තුකගමික භික්ෂූන්ට සෙනසුන් පණවන්නාහු උපද්‍රැත වෙත්. එකල්හි ඒ භික්ෂූන්ට මෙබඳු අදහසක් විය: " ඇවැත්නි, අපි දැන් ආගන්තුක ගමික භික්ෂූන්ට සෙනසුන් පණවන්නමෝ උපද්‍රැත වම්හ. ඇවැත්නි, එහෙයින් අපි සියලු සඟසතු සෙනසුන් එක් භික්ෂුවක්හට දෙමු. ඒ භික්ෂුහ සන්තක දෙය අපි පරිභොග කරන්නෙමු " යි කියා යි. (ඉක්බිති) ඒ භික්ෂූහු සියලු සඟසතු සෙනසුන් එක් භික්ෂුවක්හට (පවරා) දුන්හ. ආගන්තුක භික්ෂූහු (අවුත්) ඒ භික්ෂූන්ට මෙසේ දැන්වූහ: " ඇවැත්නි, අපට සෙනසුන් පණවනු මැනවැ " යි. " ඇවැත්නි, සඟසතු සෙනසුන් නැත. සියල්ල අප විසින් එක් භික්ෂුවකට දෙනලදැ " යි ඒ භික්ෂූහු පිළිවදන් දුන්හ. " ඇවැත්නි, කිම? තෙපි සඟසතු සෙනසුන් පුද්ගලයෙකුට දෙන්නහු දැ? " යි ආගන්තුකයෝ ඇසූහ. " ඇවැත්නි, එසේය " යි ආවාසිකයෝ පිළිවදන් දුන්හ. යම් ඒ භික්ෂුකෙනෙක් අල්පෙච්ඡ වෙත්ද ඒ භික්ෂූහු ලාමක කොට සිතත සේ වචන බෙණෙත්. නුගුණ කියත්. නුගුණ පතුරුවා කියත්. " කෙසේ නම් භික්ෂූහු සඟසතු සෙනසුන් පුද්ගලයෙකු සතු කොට දෙත් දැ? " යි කියා යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට එපවත් සැළ කළහ. " මහණෙනි, භික්ෂූහු සඟසතු සෙනසුන් පුද්ගලසන්තක කොට දෙත් ලු, ඒ සැබෑ දැ? " යි භාග්‍යවතුන්වහන්සේ විචාළසේක. " භාග්‍යවතුන් වහන්ස, සැබවැ " යි ඒ භික්ෂූහු සැළ කළහ. භාග්‍යවත් බුදුරජානන්වහන්සේ " මහණෙනි, කෙසේ නම් ඒ තුච්ඡ පුරුෂයෝ සඟසතු සෙනසුන් පුද්ගලසන්තක කොට දෙත් ද? මහණෙනි, ඒ වනාහි අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ ප්‍රසන්නයන්ගේ

ප්‍රසාදය දියුණු වනු පිණිස හෝ නො වේ. තුච්ඡපුරුෂයෙනි, යළි දු ඒ කාරණය අප්‍රසන්නයන්ගේ අප්‍රසාදය පිණිස ද ඇතැම් ප්‍රසන්නයන්ගේ අන්‍යථාභාවය පිණිස ද වේ " ය යි ගර්හා කොට වදාළ සේක. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ භික්‍ෂූන්ට නොයෙක් ක්‍රමයෙන් ගරහා දැහැමි කථා කොට භික්‍ෂූන් අමතා වදාළසේක:

" මහණෙනි, මේ රාශි පසක් සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයෙකු විසින් හෝ (මාරු කිරීම් වසයෙන් නො ව සතු කිරීම් වසයෙන්) නො දියයුතු වෙත්. දෙනලද නමුදු නො දෙනලද්දාහු ම වෙත්. යම් භික්‍ෂුනමක් දේ නම් ඔහට ථුල්ලච්චයාපත්තිය වේ. කවර පසක් ද? යත්: –

1. ආරාම ය, ආරාමවත්‍ථු ය. මේ පළමු වන රාශිය සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයෙකු විසින් හෝ (මාරු කිරීම් වසයෙන් නො ව සතු කිරීම් වසයෙන් අනෙකෙකුට) නො දියයුතු ය දෙනලද්දේ නමුදු නො දෙනලද්දේ ම වේ. යම් භික්‍ෂු නමක් දේ නම් ඔහට ථුල්ලච්චයාපත්තිය වේ.

2. විහාර ය, විහාරවත්‍ථු ය. මේ දෙ වන රාශිය සඞ්ඝයා විසින් හෝ – පෙ – ථුල්ලච්චයාපත්තිය වේ.

3. මඤ්චය, පීඨ ය, භිසි ය, බිම්බොහනය. මේ තුන් වන රාශිය සඞ්ඝයා විසින් හෝ – පෙ – ථුල්ලච්චයාපත්තිය වේ.

4. ලොහකුම්භි ය, ලොහභාණක ය, ලොහවාරක ය, ලොහකටාහ ය, වාසි ය, ඵරසු ය, කුඨාරි ය, කුද්දාල ය, නිඛාදන ය. මේ සිවු වන රාශිය සඞ්ඝයා විසින් හෝ – පෙ – ථුල්ලච්චයාපත්තිය වේ

5. වල්ලි ය, වෙළු ය, මුඤ්ජ ය, බබ්බජ ය, තිණ ය, මත්තිකා ය, දරුභණ්ඩ ය, මත්තිකාභණ්ඩ ය. මේ පස් වන රාශිය සඞ්ඝයා විසින් හෝ – පෙ – ථුල්ලච්චයාපත්තිය වේ.

මහණෙනි, මේ රාශි පස සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයෙකු විසින් හෝ (මාරු කිරීම් වසයෙන් නො ව සතු කිරීම් වසයෙන් අනෙකෙකුට) නො දියයුතු ය. දෙනලද්දාහු ද නො දෙනලද්දාහු ම වෙත්. යම් භික්‍ෂුනමක් දේ නම් ඔහට ථුල්ලච්චයාපත්තිය වේ " ය සි වදාළසේක.

" අථ ඛො භගවා සාවත්‍ථියං යථාභිරන්තං විහරිත්වා යෙන කීටාගිරිං තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාරිපුත්තමොග්ගල්ලානෙහි ච. අස්සොසුං ඛො අස්සජිපුනබ්බසුකා භික්ඛූ: " භගවා කිර කීටාගිරිං ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාරිපුත්තමොග්ගල්ලානෙහි ච. හන්ද මයං ආවුසො සබ්බං.

සඞ්ඝිකං සෙනාසනං භාජෙම. පාපිච්ඡා සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතා. න මයං තෙසං සෙනාසනං පඤ්ඤපෙස්සාමා" ති. තෙ සබ්බං සඞ්ඝිකං සෙනාසනං භාජෙසුං. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කීටාගිරි තදවසරි. අථ ඛො භගවා සම්බහුලෙ භික්ඛූ ආමන්තෙසි: "ගච්ඡථ තුම්හෙ භික්ඛවෙ අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ, උපසඞ්කමිත්වා එවං වදෙථ: "භගවා ආවුසො ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාරිපුත්තමොග්ගල්ලානෙහි ච. භගවතො ච ආවුසො සෙනාසනං පඤ්ඤපෙථ භික්ඛුසඞ්ඝස්ස ච සාරිපුත්තමොග්ගල්ලානානඤ්චා" ති. "එවං භන්තෙ" ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොචුං: "භගවා ආවුසො ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාරිපුත්තමොග්ගල්ලානෙහි ච. භගවතො ච ආවුසො සෙනාසනං පඤ්ඤපෙථ භික්ඛුසඞ්ඝස්ස ච සාරිපුත්තමොග්ගල්ලානානඤ්චාති.

"නත්ථාවුසො සඞ්ඝිකං සෙනාසනං. සබ්බං අම්හෙහි භාජිතං. ස්වාගතං ආවුසො භගවතො. යස්මිං විහාරෙ භගවා ඉච්ඡිස්සති, තස්මිං විහාරෙ වසිස්සති. පාපිච්ඡා සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතා. න මයං තෙසං සෙනාසනං පඤ්ඤපෙස්සාමා" ති. "කිං පන තුම්හෙ ආවුසො සඞ්ඝිකං සෙනාසනං භාජිත්ථා" ති. "එවමාවුසො" ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා – පෙ – විපාචෙන්ති. "කථං හි නාම අස්සජිපුනබ්බසුකා භික්ඛූ සඞ්ඝිකං සෙනාසනං භාජෙස්සන්තී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ" – පෙ –. "සච්චං භගවා." කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා සඞ්ඝිකං සෙනාසනං භාජෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය. – පෙ – විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"පඤ්චිමානි භික්ඛවෙ අවෙභඞ්ගියානි න විභජිතබ්බානි සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විභත්තානිපි අවිභත්තානි හොන්ති. යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස. කතමානි පඤ්ච? ආරාමො, ආරාමවත්ථු. ඉදං පඨමං අවෙභඞ්ගියං. න විභජිතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විභත්තම්පි අවිභත්තං හොති. යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස. විහාරො, විහාරවත්ථු. ඉදං දුතියං අවෙභඞ්ගියං – පෙ – මඤ්චො, පීඨං, භිසි, බිම්බොහනං. ඉදං තතියං අවෙභඞ්ගියං – පෙ –. ලොහකුම්භී, ලොහභා

ණකං, ලොහවාරකො, ලොහකටාහං, වාසි, ඵරසු, කුඨාරි, කුද්දාලො, නිඛාදනං. ඉදං චතුත්ථං අවෙභඞ්ගියං – පෙ –. වල්ලි, වෙළු, මුඤ්ජං, බබ්බජං, තිණං, මත්තිකා, දාරුභණ්ඩං, මත්තිකාභණ්ඩං. ඉදං පඤ්චමං අවෙභඞ්ගියං. න විභජිතබ්බං සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විභත්තම්පි අවිභත්තං හොති. යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්ස. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අවෙභඞ්ගියානි න විභජිතබ්බානි සඞ්ඝෙන වා ගණෙන වා පුග්ගලෙන වා. විභත්තානිපි අවිභත්තානි හොන්ති. යො විභජෙය්‍ය ආපත්ති ථුල්ලච්චයස්සාති."

චුල්ලවග්ගපාලි - සෙනාසනක්ඛන්ධක.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර කැමැති තාක් කල් වාසය කොට වදරා පන්සියයක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයාවහන්සේ හා සැරියුත් මූගලන් දෙදෙනා වහන්සේ සමග කිටාගිරිය යම් තැනෙක්හි ද එහි චාරිකා වශයෙන් වැඩිසේක. ෂඩ්වර්ගීය භික්ෂූන්ට අයත් වූ අස්සජිපුනබ්බසුක දෙනම "භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයාවහන්සේ හා සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ සමග කීටාගිරියට වඩනාසේකැ" යි ඇසූහ. අසා "ඇවැත්නි, එහෙනම් අපි සියලු සඟසතු සෙනසුන් බෙදා ගණුම්හ. සැරියුත් මූගලන් දෙනම ලාමක ඉච්ඡා ඇත්තෝ ය. ලාමක ඉච්ඡාවන්ගේ වසයට ගියෝ ය. අපි ඒ දෙනමට අසුන් නො පණවම්හ" යි කථා කොට ගත්හ. ඉක්බිති ඔහු තුමූ (අස්සජිපුනබ්බසුක දෙනම) සියලු සඟසතු සෙනසුන් බෙදා ගත්හ. එකල්හි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ පිළිවෙළින් චාරිකා කරණසේක් කීටාගිරිය යම් තැනෙක්හි නම් එහි වැඩිසේක. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ බොහෝ භික්ෂූන් අමතා වදාළසේක :

"මහණෙනි, තෙපි යව්. අස්සජිපුනබ්බසුක භික්ෂූන් වෙත එළඹ මෙසේ කියව්. ඇවැත්නි, භාග්‍යවතුන්වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයාවහන්සේ හා සැරියුත් මූගලන් දෙදෙනාවහන්සේ සමග වඩනාසේක. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂුසඞ්ඝයාවහන්සේට ද සැරියුත් මූගලන් දෙදෙනාවහන්සේට ද සෙනසුන් පැණවුව මැනවැ" යි කියාසි. "ස්වාමීන්වහන්ස, එහෙම "යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් අස්වා අස්සජිපුනබ්බසුක භික්ෂූහු යම තැනෙක්හි ද එතන්හි එළඹියාහු ය. එළඹ අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට මෙසේ කීවාහු ය : "ඇවැත්නි, භාග්‍යවතුන්වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයාවහන්සේ හා සැරියුත් මූගලන්

දෙදෙනා වහන්සේ සමග වඩනාසේක. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂුසඞ්ඝයාවහන්සේට ද සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේට ද සෙනසුන් පැණවුව මැනවැ" යි කියා යි. "ඇවැත්නි, සඟසතු සෙනසුන් නැත. සියල්ල අප විසින් බෙදා ගන්නාලදි. ඇවැත්නි, භාග්‍යවතුන්වහන්සේට යහපත් ඊමක් වේවා. භාග්‍යවතුන්වහන්සේ යම් විහාරයෙක්හි කැමැති වන සේක් නම් ඒ විහාරයෙහි වැඩවසනසේක. සැරියුත් මුගලන් දෙනම ලාමක ඉච්ඡා ඇත්තෝ ය. ලාමක ඉච්ඡාවන්ගේ වසයට ගියෝ ය. අපි ඒ දෙනමට සෙනසුන් නො පණවම්හ " යි.

"ඇවැත්නි, කිම? තෙපි සඟසතු සෙනසුන් බෙදූවහු ද?" "ඇවැත්නි ! එසේ ය." යම් ඒ භික්ෂූහු අාශාරහිතයෝ ද – පෙ – ලාමක කොට සිතනසේ වචන බෙණෙත්. නුගුණ කියත්. නුගුණ පතුරුවා හරිත්. අස්සජිපුනබ්බසුක භික්ෂූහු කෙසේ නම් සඟසතු සෙනසුන් බෙදා ගන්නාහු ද?" යි කියායි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට එපවත් සැළ කළහ. "මහණෙනි ! අස්සජි පුනබ්බසුක භික්ෂූහු සඟසතු සෙනසුන් බෙදා ගණිත් ලු. ඒ සැබෑ දූ?" යි භාග්‍යවතුන්වහන්සේ විචාළසේක. "භාග්‍යවතුන් වහන්ස! සැබවැ" යි අස්සජිපුනබ්බසුක භික්ෂූහු සැළකළහ. භාග්‍යවත් බුදුරජානන්වහන්සේ "මහණෙනි ! කෙසේ නම් ඒ තුච්ඡ පුරුෂයෝ සඟසතු සෙනසුන් බෙදා ගත්තාහු ද? මහණෙනි ! ඒ වනාහි අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ ප්‍රසන්නයන්ගේ ප්‍රසාදය දියුණු වනු පිණිස හෝ නො වේ. තුච්ඡ පුරුෂයෙනි ! යළි දූ ඒ කාරණය අප්‍රසන්නයන්ගේ අප්‍රසාදය පිණිස ද ඇතම් ප්‍රසන්නයන්ගේ අන්‍යථාභාවය පිණිස ද වේ ය" යි ගැහී කොට වදාළසේක. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ භික්ෂූන්ට නොයෙක් ක්‍රමයෙන් ගරහා දැහැමි කථා කොට භික්ෂූන් අමතා වදාළසේක :

"මහණෙනි ! මේ රාශි පසක් සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයෙකු විසින් හෝ අවෙභඞ්ගිය වෙත්. නො බෙදිය යුත්තාහ. බෙදනලද්දාහු නමුදු නො බෙදන ලද්දාහු ම වෙත්. යම් භික්ෂුනමක් බෙදයි නම් ඔහට ථුල්ලච්චයාපත්තිය වේ."

කවර පසක් ද? යත් : –

1. ආරාම ය, ආරාම වත්ථුය. මේ පළමු වන රාශිය සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයෙකු විසින් හෝ නො බෙදිය යුතු ය. බෙදන ලද්දේ නමුදු නො බෙදන ලද්දේ ම වේ. යම් භික්ෂුනමක් බෙදයි නම් ඔහට ථුල්ලච්චයාපත්තිය වේ.

2. විහාර ය, විහාරවත්ථු ය. මේ දෙ වන රාශිය සඞ්ඝයා විසින් හෝ – පෙ – ථුල්ලච්චයාපත්තිය වේ.

3. මඤ්ච ය, පීඨ ය, භිසි ය, බිම්බොහන ය. මේ තුන් වන රාශිය සඞ්ඝයා විසින් හෝ - පෙ - ථුල්ලච්චයාපත්තිය වේ.

4. ලෝහකුම්භි ය, ලෝහභාණක ය, ලෝහවාරක ය, ලෝහ කටාහ ය, වාසි ය, ඵරසු ය, කුඨාරි ය, කුද්දාල ය, නිඛාදන ය. මේ සිව්වන රාශිය සඞ්ඝයා විසින් හෝ - පෙ - ථුල්ලච්චයාපත්තිය වේ.

5. වල්ලි ය, වේළු ය, මුඤ්ජ ය, බබ්බජ ය, තිණ ය, මත්තිකා ය, දාරුභණ්ඩ ය, මත්තිකාභණ්ඩ ය. මේ පස් වන රාශිය සඞ්ඝයා විසින් හෝ - පෙ - ථුල්ලච්චයාපත්තිය වේ.

මහණෙනි, මේ රාශි පස සඞ්ඝයා විසින් හෝ ගණයා විසින් හෝ පුද්ගලයෙකු විසින් හෝ නො බෙදිය යුතු ය. යම් භික්ෂු නමක් බෙදයි නම් ඒ භික්ෂුහට ථුල්ලච්චයාපත්තිය වේ ” ය යි වදාළසේක.

මේ දක්වන ලද්දේ අවිස්සජ්ජිය අවේභඞ්ගිය ගරුභණ්ඩ මේ මේ ය යි සර්වඥයන්වහන්සේ විසින් වදාරණලද, චුල්ලවග්ගපාලියෙහි සේනාසනක්ඛන්ධකයෙහි ආ පාඨ හා ඒ පිළිබඳ සංක්ෂිප්ත භාවය යි.

රාශි වශයෙන් පසක් අවිස්සජ්ජිය බව ද අවේභඞ්ගිය බව ද එයින් පැණේ. එතෙකුදු වුව සරූප වසයෙන් නම් පසක් නො ව පස්විස්සෙකි.

“ විසඞ්ගහානි වෙ හොන්ති - තතියං චතුසඞ්ගහං,
චතුත්ථං නවකොට්ඨාසං - පඤ්චමං අට්ඨභෙදනං.
ඉති පඤ්චහි රාසීහි - පඤ්චනිම්මලලොචනො,
පඤ්චවීසවිධං නාථො - ගරුභණ්ඩං පකාසයි. ”

යනු ඒ පිළිබඳ ආචාර්‍ය්‍යවචන යි.

මෙසේ පළමුවන දෙවන රාශි දෙක ආරාම - ආරාමවත්ථු, විහාර - විහාරවත්ථු වසයෙන් දෙකකින් සඞ්ග්‍රහ කරණලදි. තුන්වන රාශිය මඤ්ච, පීඨාදි සතරකින් සඞ්ගෘහීත ය. සිව්වන රාශිය ලෝහකුම්භි, ලෝහභාණකාදි නවයකින් සඞ්ගෘහීත ය. පස්වන රාශිය වල්ලි, වේළු ආදි අටකින් සඞ්ගෘහීත යි. මෙසේ රාශි පස සරූප වසයෙන් පස්විස්සක් වන සැටි දතයුතු.

මෙකී වස්තු මූලච්ඡේදවශයෙන් අවිස්සජ්ජිය ද අවේභඞ්ගිය ද වේ. පරිවර්තන (= මාරු කිරීම්) වශයෙන් අනෙකෙකුම දෙන්නහුට ද පරිභොග කරන්නහුට ද අනාපත්ති වේ.

එහෙයින් වදාළහ, පරිවාරපාළියෙහි :-

“ අවිස්සජ්ජියං අවෙභඞ්ගියං පඤ්ච වුත්තා මහෙසිනා
විස්සජ්ජෙන්තස්ස පරිභුඤ්ජන්තස්ස අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා” යි.

මහර්ෂි වූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ විසින් අවිස්සජ්ජිය අවෙභඞ්ගිය (= අනෙකෙකුට පවරා නොදිය යුතු, බෙදා නොගත යුතු) වස්තු පසක් වදාරණලදි. පවරා දෙන්නහුට ද බෙදා ගන්නහුට ද අනාපත්ති වේ. මේ ප්‍රශ්නය පණ්ඩිතයන් විසින් සිතනලදි. මෙයින් හඟවනලද්දේත් ගරුභාණ්ඩ මූලච්ඡේදවශයෙන් අවිස්සජ්ජිය - අවෙභඞ්ගිය බව හා පරිවත්තනය කරන්නහුට අනාපත්ති බව යි. පරිවත්තන ක්‍රමය මතු දක්වනු ලැබේ.

ගරු භාණ්ඩ යන්නෙහි වචනාර්ථ මෙසේ යි :-

තත්ථ ගරූ ති :-

" පුමෙ ආචරියාදිම්හි - ගරු මාතාපිතූසුපි,
ගරු තිසු මහන්තෙ ච - දුජ්ජරා ලහුකෙසු චා " ති -
වුත්තෙසු අනෙකත්ථෙසු අලහුකවාචකො.

භණ්ඩසද්දො :-

" භාජනාදිපරික්ඛාරෙ - භණ්ඩං මූලධනෙපි චා " ති -
එත්ථ භාජනාදි පරික්ඛාරත්ථො හොති.

වචනත්ථො පන " ගරූනාති උග්ගවජ්ජන්ති උග්ගතා පාකටා හොන්තීති = ගරූති; භණ්ඩිතබ්බානි ඉච්ඡිතබ්බානීති = භණ්ඩානි; ගරූනි ච තානි භණ්ඩානි චෙති = ගරුභණ්ඩානි; ආරාමාදීනි වත්ථූනි."

විනයාලඞ්කාර.

ආචාර්‍ය්‍යඋපාධ්‍යායාදීන් කෙරෙහි ද මවුපියන් කෙරෙහි ද වැටෙන්නා වූ ගරු නාමය පුල්ලිඞ්ගයෙහි වෙයි. මහත් දෙයෙහි ද නො දිරණ දෙයෙහි ද සැහැල්ලු නො වන දෙයෙහි ද වැටෙන කල්හි ලිඞ්ගත්‍රයෙහි පැණේ.

මෙසේ දක්වනලද අනෙකාර්ථයන් අතුරෙන් මෙහි ගරු නාමය සැහැල්ලු නො වන දෙයෙහි වැටේ.

භණ්ඩ නාමය භාජනාදි වූ උපකරණයෙහි ද වෙළඳාම් මිල වූ ධනයෙහි ද වැටේ. මෙහි භාජනාදි වූ උපකරණය යන අර්ථ ඇත්තේ වේ. වචනාර්ථය වනාහි 'ගරූනාති' යි සේයි, 'උග්ගවජ්ජන්ති' යි සේයි, ප්‍රකට වෙත් නු යි ගරු නම් වෙත්. 'භණ්ඩිතබ්බානි' යි සේයි, කැමැති විය යුත්තාහු නු යි භාණ්ඩ නම් වෙත්. ගරු වූවෝත් ඔහු ම ය, භණ්ඩ වූවෝත් ඔහු ම නු යි ගරුභාණ්ඩ නම් වෙත්. ආරාමාදි වස්තුහු යි.

"ඉසුරු පමුණුවා සඟසතු ගුරුබඩ අන්නට දේ නම් ථුල්ලැසි වේ."

සබවලඳ

ආරාම් – ආරාමවත්ථු – ගරුභණ්ඩ ච, විහාර – විහාරවත්ථු – ගරුභණ්ඩ ච, මඤ්ච - පීඨ - **භිසි – බිම්බොහනානි ඉමෙසු චතුසු ගරුභණ්ඩෙසු ච, ලොහකුම්භි – ලොහථාලක – ලොහවාරක – ලොහකටාහ – වාසි – ඵරසු – කුඨාරි – කුද්දාල – නිඛාදනානීති ඉමෙසු නවසු ගරුභණ්ඩෙසු ච, වල්ලි – වෙළු ආදිසු අට්ඨසු ගරුභණ්ඩෙසු චාති ඉමෙසු පඤ්චසු කොට්ඨාසෙසු අඤ්ඤතරං අහමෙව ඉස්සරොති ඉස්සරභාවෙන අඤ්ඤස්ස දදෙය්‍ය ථුල්ලච්චයං. ථෙය්‍යචිත්තෙන පාදග්ඝනකං වා පාදාතිරෙකං වා අඤ්ඤස්ස දදෙය්‍ය සයං වා ගණ්හෙය්‍ය පාරාජිකං.**"

සික්ඛාපදවලඤ්ජන.

"සඟසතු අරම්, අරම්වත යන මෙ දෙක එක් ගුරුබඩෙක්. වෙහෙර, වෙහෙරවත යන මෙ දෙක එක් ගුරුබඩෙක්. ඇඳ, පුටු, බිසි, කන්වයින් යන මෙ සතර එක් ගුරුබඩෙක්. ලොහොසැළ, ලොහොපැණ, ලොහොපණා, ලොහොකටාර, වෑ, පොරෝ, කෙටේරි, කුදලු, නියන් යන මෙ නවය එක් ගුරුබඩෙක්. වැල්, හුණ, මුදුතණ, බබුස්තණ, සෙසු ගේ සොයන තණ, මැටි, මැටිබජන, දරමුවා පිරිකර යන මෙ අට එක් ගුරුබඩෙක් මෙ පස් ගුරුබඩින් එක්තරාක් මා මිස කෙ දූ යි ඉසුරු පමුණුවා අන්නට දේ නම් ථුලැසි වෙ. සොරසිතින් පල් පොහොනා වතක් එවු වඩා අගනාක් එවු අන්නට දේ නම් තෙමේ ගණී නම් පරිජි වෙ. පලින් උනු වියපින් වඩා ඉතිරි අගනාක් දේ නම් ගණී නම් ථුලැසි වෙ. වියටක් එවු වියපින් උනු අගනාක් එවු ගණී නම් දේ නම් දුකුළා වෙ."

සිබවළඳ විනිස.

මේ පඤ්ච ගරුභාණ්ඩයන් අතුරෙන් එක්තරා එකක් මා මිස වෙන කවරෙක් මෙහි අයිතිකරු ද යි තමා අධිපති කොට සිතා අනෙකෙකුට දේ නම් ථුල්ලච්චයාපත්ති වේ. සොරසිතින් ඔවුනතුරෙන් පාදයක් වටනා වස්තුවක් හෝ පාදයකට වඩා වටිනා වස්තුවක් හෝ අනෙකෙකුට දේ නම් තෙමේ ගණී නම් පාරාජිකාපත්තිය වේ. සොරසිතින් පාදයකට වඩා අඩු වියටකට වඩා වැඩි වටිනාකම ඇති වස්තුවක් අනෙකෙකුට දේ නම් හෝ තෙමේ ගණී නම් හෝ ථුල්ලච්චයාපත්තිය වේ. වියටක් වටනා හෝ වියටකට අඩු ව වටනා හෝ වස්තුවක් දේ නම් හෝ ගණී නම්

" සඞ්ඝිකං ගරුකං භණ්ඩං – යො දෙත්‍යඤ්ඤස්ස ඉස්සරො,
ථුල්ලච්චයං යථාවත්ථු – ථෙය්‍යා පාරාජිකාදිපි. "

මූලසික.

යො – යම් භික්ෂුවක් තෙම; ඉස්සරො – ඉසුරු වූයේ; සඞ්ඝිකං – සඞ්ඝ සන්තක වූ; ගරුකං භණ්ඩං – ගරු බඩු; අඤ්ඤස්ස – අනෙකෙකුට; දෙති – දේ නම්; ථුල්ලච්චයං – (ඕහට) තුලැසි (නම් ඇවැ

තෙක් වේ.) ථෙය්‍යා – සොරසිතින්; (අඤ්ඤස්ස – අනෙකෙකුට; දෙති – දේ නම්;) යථාවත්‍ථු – වස්තු වූ පරිද්දෙන් හෙවත් බඩු අගනා සෙයින්; පාරාජිකාදිපි, පරිජි ආදි ද වෙයි.”

මූලසික්ඛා සන්න.

“මේ මැසිපුටු ඈ සඟහට දෙමි යි කල ගුරු බඩු වෙයි. නො බෙජිය යුතු. සඟිනි පිරිසැජිනි බැවිනි. මෙසැජි හිමියනට වසෙ ගිනි ගන්නට දෙමියි කල ගුරුබඩු හොතුජ් කෙපෙවත බෙජෙයි. වසෙගිනි ගණුතු වටියි වා කී සෙයිනි කරත දෙස නැත.

අයපවත බෙජෙයි ගත නො ලැබෙයි. මේ මැසිපුටු වසෙගිනි ගන්නට සඟහට දෙමි යි කිව දෙස නැති. පළමි සඟිහි පෙරෙයි ජිමි කියා යි කල ගුරුබඩු වෙයි.”

කඞ්ඛාවිතරණී ගැටපද.

“මේ ඇඳපුටු ආදිය සඞ්ඝයාට දෙමි” යි කීකල්හි ගරුභණ්ඩ වෙයි. නො බෙදිය යුතු ය. සඞ්ඝයා වසයෙන් පරිත්‍යක්ත බැවිනි. “මේ පරිත්‍යාගය ස්වාමීන්වහන්සේලාට වස්සග්ගයෙන් ගන්නට දෙමි” යි කීකල්හි ගරුභණ්ඩ වෙතත් කප්පියවත්‍ථු භජනය කෙරෙයි. “වස්සග්ගයෙන් ගණීතොත් වටියි” යන වාක්‍යයෙහි කිසෙයින් කරණ කල්හි දෙස් නැත්තේ ය.

අකැප වස්තුව භජනය කෙරේ නම් ගන්නට නො ලැබේ. මේ ඇඳපුටු වස්සග්ගයෙන් ගන්නට සඞ්ඝයාට කිවහොත් දොෂයෙක් නැත්තේ ය. “පළමු සඞ්ඝයා කෙරෙහි පරිත්‍යාග කෙරෙමි” යි කීකල ගරුභණ්ඩ වෙයි.

“ආරාමාරාමවත්‍ථූනි විහාරො තස්ස වත්‍ථු ච,
මඤ්චො පීඨං භිසිබිම්බොහනාදිසයනාසනං.

ලොහකුම්භි කටාහො ච ලොහභාණකවාරකො,
කුඨාරී වාසි ඵරසු කුද්දාලො ච නිඛාදනං.

වල්ලි වෙළු තිණං පණ්ණං මුඤ්ජබබ්බජමත්තිකා,
දාරුමත්තිකභණ්ඩානි පඤ්චෙතෙ අවිභාජියා.

ථුල්ලච්චයං භාජයතො භාජිතාපි අභාජිතා,
ගරුභණ්ඩානි වුච්චන්ති එතෙ’විස්සජ්ජියානි ච.”

ඛුද්දසික්ඛා.

“ආරාමාරාම වත්‍ථූනි – පෙ – දාරුමත්තිකභණ්ඩානී” ති එතෙ පඤ්ච අවිභාජියා’’ ති සම්බන්ධිතබ්බං. “පඤ්ච” ති ආරාමාරාම වත්‍ථූනි එකන්ති ආදිනා රාසිවසෙන පඤ්ච. සරූපවසෙන පනෙතානි පණ්ණං තිණෙ පක්ඛිපිත්‍වා පඤ්චවීසතිවිධානි හොන්ති.

තථාහ :–

"ද්විසඞ්ගහානි ද්වෙ හොන්ති – තතියං චතුසඞ්ගහං,
චතුත්ථං නවකොට්ඨාසං – පඤ්චමං අට්ඨභෙදනං.
ඉති පඤ්චහි රාසීහි – පඤ්චනිම්මලලොචනො,
පඤ්චවීසවිධං නාථො – ගරුභණ්ඩං පකාසයී'' ති–

තත්ථ ආරාමො නාම පුප්ඵාරාමො වා ඵලාරාමො වා. ආරාමවත්ථු නාම තෙසංයෙව පතිට්ඨානොකාසො; විනට්ඨෙසු වා තෙසු පොරාණකභූමිභාගො. විහාරො නාම පාසාදාදි යං කිඤ්චි සෙනාසනං. ලොහකුම්භී නාම කාළලොහෙන වා තම්බලොහෙන වා කතකුම්භී. කටාහාදීසුපි එසෙව නයො. එත්ථ භාණකන්ති අරඤ්ජරො වුච්චති. වාරකොති ඝටො. රාසිං අපෙක්ඛිත්වා එතෙහි පුල්ලිඞ්ගනිද්දෙසො. අවිභාජියානි මූලච්ඡෙජ්ජවසෙන අවෙභඞ්ගියා. පරිවත්තනවසෙන පන පරිභුඤ්ජන්තස්ස විස්සජ්ජන්තස්ස අනාපත්ති. අවිස්සජ්ජියානි චාති චසද්දෙන අවෙභඞ්ගියානි චාති අවුත්තං සම්පිණ්ඩෙති; එකන්තගරුභණ්ඩත්තා.''

ඛුද්දසික්ඛා ටීකා.

ආරාම – පුෂ්පාරාම ඵලාරාම ද; ආරාමවත්ථූති – ආරාමභූමි ද; විහාරො – ප්‍රාසාදාදි සෙනසුන් ද; තස්ස වත්ථු ච – ඒ විහාරය සම්බන්ධ භූමි ද; මඤ්චො – ඇඳ ද; පීඨං – පුටු ද; භිසි – (පඤ්චවිධ) භිසිනු ද: බිම්බොහනාදි සයනාසනං – කන්වයින් ඈ හෝනා හිඳිනා දෑ ද.

ලොහකුම්භී – ලොහො සැළි ද; කටාහො ච – ලොහො කටාරම් ද; ලොහභාණක– ලොහො සැළ ද; වාරකො – ලොහො කළ ද; කුඨාරි – කෙටේරි ද; වාසි – වෑ ද; ඵරසු – පොරෝ ද; කුද්දාලො ච – හුදලු ද; නිඛාදනං – නියන් ද.

වල්ලි – (වේවැල් ඈ) වැල් ද; වෙළු – (මහහුණ ඈ) හුණ ද; තිණං–(ඉලුක් ඈ ගේ සොයත) තණ ද; පණ්ණං – (තල්පත් ඈ) පත් ද; මුඤ්ජ – මුදුතණ ද; බබ්බජ – බබුස්තණ ද; මත්තිකා – මැටි ද; දාරුමත්තිකාභණ්ඩානි – දාරුභණ්ඩ මත්තිකාභණ්ඩ ද යන; එතෙ පඤ්ච – මේ පඤ්ච රාශීහු; අවිභාජියා – සඞ්ඝ ගණ පුද්ගල යන් විසින් නො බෙදිය යුත්තාහු යි.

භාජයතො – බෙදන්නාහට; ථුල්ලච්චයං – ථුලැසි වෙයි; භාජිතාපි – බෙදනලද්දාහු ද; අභාජිතා – නො බෙදනලද වෙත්. එතෙ – මොහු; ගරුභණ්ඩානි – ගරු භාණ්ඩයහ යි ද; අවිස්සජ්ජියානි ච – නො දියයුත්තාහ යි ද (ච ශබ්දයෙන් අවෙභඞ්ගියහ යි ද) වුච්චන්ති – කියනු ලැබෙති.

ඛුද්දසික්ඛාසන්න

1. ආරාම.

" තත්‍ථ ආරාමොති පුප්ඵාරාමො ඵලාරාමො වා. "

සමන්තපාසාදිකා.

ආරාම නම් මල්වතු හෝ පොල් (පලතුරු) වතු ය.

2. ආරාමවත්‍ථු.

"ආරාමවත්‍ථු නාම තෙසංයෙව ආරාමානං අත්‍ථාය පරිච්ඡින්‍දිත්‍වා ඨපිතොකාසො. තෙසු වා ආරාමෙසු විනට්ඨෙසු තෙසං පොරාණකභූමිභාගො. "

සමන්තපාසාදිකා.

ආරාමවත්‍ථු නම් ඒ ආරාමයන්ගේ ප්‍රයොජනය පිණිස ම වෙන් කොට තබනලද භූමිභාගය යි. නැත හොත් එ කී ආරාමාදිය විනෂ්ට ව ගිය කාල්හි ඒ පිළිබඳ පැරණි බිම්පෙදෙස යි.

3. විහාර.

" විහාරො නාම යං කිඤ්චි පාසාදදිසෙනාසනං. "

සමන්තපාසාදිකා.

විහාර නම් ප්‍රාසාදදි යම් කිසි සෙනාසනයෙකි.

4. විහාරවත්‍ථු.

" විහාරවත්‍ථු නාම තස්ස පතිට්ඨානොකාසො. "

සමන්තපාසාදිකා.

විහාරවත්‍ථු නම් එකී සෙනාසනය පිහිටි අවකාශ ස්ථානය (= වත්ත) යි.

තුන් වන රාශියට අයිති මඤ්ච, පීඨ, භිසි, බිම්බොහනයන් පිළිබඳ විනිශ්චය මෙසේ යි.

5. මඤ්ච.

"මඤ්චො නාම මසාරකො බුන්දිකාබද්ධො කුළීරපාදකො ආහච්චපාදකොති ඉමෙසං චතුන්නං මඤ්චානං අඤ්ඤතරො. "

සමන්තපාසාදිකා.

මඤ්ච (= හැඳ) නම් මසාරකය, බුන්දිකාබද්ධය, කුළීරපාදකය, ආහච්චපාදකය යන මේ සිවුවැදෑරුම් මඤ්චයන් අතුරෙන් එක්තරා එකකි.

"මසාරකොති මඤ්චපාදෙ විජ්ඣිත්‍වා තත්‍ථ අටනියො පවෙසෙත්‍වා කතො. බුන්දිකාබද්ධොති අටනීහි මඤ්චපාදෙ ඩසාපෙත්‍වා පල්ලඞ්කසඞ්ඛෙපෙන කතො. කුළීරපාදකොති අස්සමෙණ්ඩකාදීනං පාදසදිසෙහි පාදෙහි කතො. යො වා පන කොචි වඞ්කපාදකො අයං වුච්චති කුළීරපාදකො. ආහච්චපාදකොති අටනියො විජ්ඣිත්‍වා තත්‍ථ පාදෙ සිඛං පවෙසෙත්‍වා උපරි ආණිං දත්‍වා කත මඤ්චො. "

සාරත්‍ථදීපනී.

"මසාරක නම් හැඳ පය විද ඇවුනු හැඳ ය. බුන්දිකාබද්ධ නම් වලින් හැඳ පය බඟවා කළ හැඳ ය. කුළීරපාද නම් කකුළුවන් පා සේ පා ඇති හැඳ ය. ආහච්චපාද නම් හැඳවල ම විද පාසිළු වද්දා ගැසූ පෝරුඇඳ ආදිය යි. හැඳ මත් හිස විද පාසිළු ගන්වා සිළු මුදුනෙහි ඇණ නො ගැසූ වියූ හැඳ ආහච්චපාදක නම් වේ.

බුන්දිකාබද්ධොටතිදටෙඨා – පීඨපාදෙ මසාරකො,
කුළීරපාදෙ තබ්බෙඩකා – විද්ධඩකාහච්චපාදකො."

කඞ්ඛාවිතරණී පිටපත.

සිළු මුදුනේ ඇණ නො ගැසූ හැඳ ආහච්චපාදක ය යි මෙහි ආ නමුත් "තඬ පාදෙ සිඛං පවෙසෙත්වා උපරි ආණිං දත්වා" යන "සාරත්ථදීපනී" පාඨයෙන් හැඟෙන්නේ සිළු මුදුනේ ඇණ ගැසූ හැඳ ආහච්චපාදකය බව යි.

6. පීඨං

"පීඨෙපි එසෙව නයො."

ඇඳ පිළිබඳ යම් ප්‍රභෙදයක් දක්වන ලද ද පුටුව පිළිබඳ ව ද ඒ එසේ ම දතයුතු වේ.

"පීඨං නාම මසාරකාදීනංයෙව චතුන්නං පීඨානං අඤ්ඤතරං." පුටුව නම් මසාරකාදි පුටු සතර වර්ගයෙන් එක්තරු එකෙකි. යනුවෙන් ද එය ම හඟවයි.

7. භිසි.

"භිසි නාම උණ්ණාභිසි ආදීනං පඤ්චන්නං අඤ්ඤතරා."

සමන්තපාසාදිකා.

භිසි නම් උණ්ණාභිසි ආදි පස් වැදෑරුම් භිසි අතුරෙන් එක්තරු එකකි.

"උණ්ණාභිසි ආදීනං පඤ්චන්නං අඤ්ඤතරාති උණ්ණාභිසි චොළභිසි වාකභිසි තිණභිසි පණ්ණභිසීති ඉමෙසං පඤ්චන්නං භිසීනං අඤ්ඤතරා. පඤ්ච භිසියො උණ්ණාදීහි පූරිතභිසියො. තුලගණනායාති එතාසං ගණනා. තත්ථ උණ්ණාගහණෙන කෙවලං එළකලොමමෙව ගහිතං. ඨපෙත්වා පන මනුස්සලොමං යං කිඤ්චි කප්පියාකප්පියමංසජාතීනං පක්ඛිං චතුප්පදානං ලොමං සබ්බං ඉධ උණ්ණාගහණෙනෙව ගහිතං. තස්මා ඡන්නං චීවරානං ඡන්නං අනුලොමචීවරානං ච අඤ්ඤතරෙන භිසිච්ඡවිං කත්වා තං සබ්බං පක්ඛිපිත්වා භිසිං කාතුං වට්ටති. එළකලොමානි පන අපක්ඛිපිත්වා කම්බලමෙව චතුගුණං වා පඤ්චගුණං වා පක්ඛිපිත්වා කතාපි උණ්ණාභිසිසඞ්ඛ්‍යමෙව ගච්ඡති. චොළභිසිආදිසු යං කිඤ්චි නව චොළං වා සංහරිත්වා වා අන්තො පක්ඛිපිත්වා වා කතා චොළභිසි.

යං කිංචි වාකං පක්ඛිපිත්වා කතා වාකභිසි. යං කිඤ්චි තිණං පක්ඛිපිත්වා කතා තිණභිසි. අඤ්ඤත්‍ර සුද්ධතමාලපත්තං යං කිඤ්චි පණ්ණං පක්ඛිපිත්වා කතා පණ්ණභිසීති වෙදිතබ්බා. තමාලපත්තං පන අඤ්ඤෙන මිස්සං වට්ටති. භිසියා පමාණනියමො නත්ථි. මඤ්චභිසි පීඨභිසි භුම්මත්ථරණභිසි චඞ්කමණභිසි පාදපුඤ්ඡන භිසීති එතාසං අනුරූපතො සල්ලක්ඛෙත්වා අත්තනො රුචිවසෙන පමාණං කාතබ්බං. යං පනෙතං උණ්ණාදිපඤ්චවිධං තූලං භිසියං වට්ටති. තං මසූරකෙ වට්ටතීති කුරුන්දියං වුත්තං. ”

විනයාලඞ්කාර.

(1) උණ්ණාභිසි
(2) චොලභිසි
(3) වාකභිසි
(4) තිණභිසි
(5) පණ්ණාභිසි ය යි බිසි පස් වැදෑරුම් වෙයි.

ඛොම, කප්පාසික, කොසෙය්‍ය, කම්බල, සාණ, භඞ්ග යන සවැදෑරුම් සිවුරු අතුරෙන් එකකින් හෝ දුකූල, පත්තුණ්ණ, චීනපට්ට, සොමාරපට්ට, ඉද්ධිජ, දෙවදින්න ය යි කියනලද සවැදෑරුම් අනුලොම් සිවුරු අතුරෙන් එකකින් හෝ බිසි උරය තනා එහි තුල නො කැප මස් ඇති මනුෂ්‍ය අශ්ව ආදීන්ගේ ලොම් හැර මස් කැප වූ හෝ නොකැප වූ පක්ෂීන්ගේ පිහාටු ද සිවුපාවන්ගේ ලොම් ද බහා කරණලද බිස්ස උණ්ණාභිසි නම වේ. එළු ලොම් නො දමා කම්බලයක් ම සතර පස් පටක් කොට හකුලා උරයෙහි බහා තනන ලද්දේ ද උණ්ණාභිසි මැ යි.

එහි “ඛොම නම් කොමු සිවුරු; ඛොම නම් ගසෙකැ නමි. එගසැ වැහැරියෙන් වියූ සිවුරු ද කාර්‍ය්‍යයෙහි කාරණොපචාර ව්‍යවහාරයෙන් ‘ ඛොමං ’ යි යුහු. කප්පාසං යනු දු මෙසේ මැ යි. කොස නම් තිහිරිපතැ. මෙයින් කළ සිවුරු කොසෙන නිබ්බත්තං = කොසෙය්‍යං යනු වේ. සාණ යනු ඛොම සේ මැ යි. ” දුකූල – දුහුල් පිළී; පත්තුණ්ණ දෙශයෙන් ලද නම් ඇති පිළී පත්තුණ්ණ පට නමි. සොමාර දෙශයෙහි උපන් පිළී සොමාරපට නමි. චීන දෙශයෙහි උපන් පිළී චිනපට නමි. සෘද්ධි වශයෙන් නිමිත සිවුරු ඉද්ධිජ නමි. අනුරුත් මහතෙරුන්ට දෙවඟනක දුන්නා සේ දෙවියන් දුන් සිවුරු දෙවදින්න නමි.

යම් කිසි අළුත් වස්ත්‍රයක් හකුලා හෝ රෙදි කැබලි ඇතුළත බහා ලීමෙන් හෝ කරණලද බිස්ස චොලභිසි නම් වේ.

යම් කිසි වැහැරියක් බහා කරණලද්දී වාකභිසි නම් වේ. කෙඳිවලින් යුත් අන්‍යවර්ගයක් බහා කරණලද බිස්ස ද එහි ම ඇතුළත් ය. යම් කිසි තෘණයක් බහා කරණලද්දී තිණභිසි නම් වේ.

හුදකලා තමලුපත් හැර අන් කිසි පත්‍රවර්ගයක් බහා කරණ ලද්දී පණ්ණභිසි නම් වේ.

තමලුපත් අන් කිසි පත්‍ර වර්ගයක් සමග මිශ්‍ර කොට කරණලද කිසි හැප වෙයි. කිස්සෙහි ප්‍රමාණනියමයෙක් නැත්තේ ය.

"යෙන කෙනචි පන චොළෙන වා කප්පියචම්මෙන වා ඡවිං කත්වා ඨපෙත්වා මනුස්සලොමං තාලීසපත්තං ච යෙහි කෙහිචි ලොමපණ්ණතිණවාකචොළෙහි පූරෙත්වා කතසෙනාසනං භිසීති වුච්චති. තත්ථ නිසීදිතුම්පි නිපජ්ජිතුම්පි වට්ටති. පමාණපරිච්ඡෙදොපි චෙත්ථ නත්ථි.

කඞ්ඛාවිතරණී.

"තාලීසපත්ත නම් සුගන්ධජාතියෙකි. තමලුපත, කොල්ලන් කොළ යැ යෙත්."

කඞ්ඛාවිතරණී පිටපත.

8. බිම්බොහන.

"බිම්බොහනෙ තීණි තූලානි රුක්ඛතූලං ලතාතූලං පොටකිතූලන්ති. තත්ථ රුක්ඛතූලන්ති සිම්බලිරුක්ඛාදීනං යෙසං කෙසඤ්චි රුක්ඛානං තූලං. ලතාතූලන්ති ඛීරවල්ලිආදීනං යාසං කාසඤ්චි ලතානං තූලං. පොටකිතූලන්ති පොටකිතිණාදීනං යෙසං කෙසඤ්චි තිණජාතිකානං අන්තමසො උච්ඡුනළාදීනම්පි තූලං. සාරත්ථදීපනියං පන පොටකිතූලන්ති එරකතිණතූලන්ති වුත්තං. එතෙහි සබ්බභූතගාමා සඞ්ගහිතා හොන්ති රුක්ඛවල්ලිතිණජාතියො හි මුඤ්චිත්වා අඤ්ඤො භූතගාමො නත්ථි තස්මා යස්ස කස්සචි භූතගාමස්ස තූලං බිම්බොහනෙ වට්ටති. භිසිං පන පාපුණිත්වා සබ්බමෙතං අකප්පියතූලන්ති වුච්චති න කෙවලඤ්ච බිම්බොහනෙ එතං තූලමෙව හංසමොරාදීනං සබ්බසකුණානං සීහාදීනං සබ්බචතුප්පදානඤ්ච ලොමම්පි වට්ටති පියඞ්ගුපුප්ඵබකුලපුප්ඵාදීනං පන යං කිඤ්චි පුප්ඵං න වට්ටති තමාලපත්තං සුද්ධමෙව න වට්ටතීති. මිස්සකං පන වට්ටති. භිසීනං අනුඤ්ඤාතං පඤ්චවිධං උණ්ණාදිතූලම්පි වට්ටති.

අඩ්ඪකායිකානි පන බිම්බොහනානි න වට්ටන්ති. අඩ්ඪකායිකානීති උපඩ්ඪකායප්පමාණානි යෙසු කටිතො පට්ඨාය යාව සීසං උපදහන්ති ඨපෙන්ති. සීසප්පමාණං පන වට්ටති. සීසප්පමාණං නාම යස්ස විත්ථාරතො තීසු කණ්ණෙසු ද්වින්නං කණ්ණානං අන්තරං මිනියමානං විදත්ථි චෙව චතුරඞ්ගුලඤ්ච හොති මජ්ඣට්ඨානං මුට්ඨිරතනං හොති, දීඝතො පන දියඩ්ඪරතනං වා ද්වෙරතනං වාති කුරුන්දියං වුත්තං. අයං සීසප්පමාණස්ස උක්කට්ඨපරිච්ඡෙදො. ඉතො උද්ධං න වට්ටති හෙට්ඨා වට්ටතීති අට්ඨකථායං වුත්තං.

තත්ථ තීසු කණ්ණෙසු චිත්තං කණ්ණානන්ති පාඨං උපනිධාය බිම්බොහනස්ස උභොසු අන්තෙසු ඨපෙතබ්බචොලකන්ති කොණමෙව කරොන්ති. එකච්චෙ ඉදඤ්ච ඨානං ගණ්ඨිට්ඨානන්ති වදන්ති. විමතිවිනොදනියං පන සීසප්පමාණං නාම යත්ථ ගීවාය සහ සකලසීසං ඨපෙතුං සක්කා තස්ස ච මුට්ඨිරතනං විත්ථාරප්පමාණන්ති දස්සෙන්තො විත්ථාරතොති ආදිමාහ. ඉදඤ්ච බිම්බොහනස්ස උභොසු අන්තෙසු ඨපෙතබ්බචොලප්පමාණදස්සනං, තස්ස වසෙන බිම්බොහනස්ස විත්ථාරප්පමාණං පරිච්ඡිජ්ජති. තං වට්ටං වා චතුරස්සං වා සිබ්බිතං යථා කොටිතො කොටි විත්ථාරතො පුථුලට්ඨානං මුට්ඨිරතනප්පමාණං හොති එවං සිබ්බිතබ්බං. ඉතො අධිකං න වට්ටති. තං පන අන්තෙසු ඨපිතචොලා කොටියා කොටිං ආහච්ච තිගුණකතං කණ්ණං හොති. තෙසු තීසු කණ්ණෙසු චිත්තං කණ්ණානං අන්තරං විදත්ථිචතුරඞ්ගුලං හොති. මජ්ඣට්ඨානං කොටිතො කොටිං ආහච්ච මුට්ඨිරතනං හොති. ඉදමස්ස උක්කට්ඨප්පමාණන්ති වුත්තත්තා බිම්බොහනස්ස උභොසු අන්තෙසු ඨපෙතබ්බචොලකං පකතියායෙව තිකණ්ණං න හොති අථ ඛො කොටියා කොටිං ආහච්ච තිගුණකතකාලයෙව හොති. තස්මා තං චොලකං වට්ටං වා හොතු චතුරස්සං වා තිගුණං කත්වා මිතියමානං තිකණ්ණමෙව හොති. චිත්තඤ්ච කණ්ණානං අන්තරං චතුරඞ්ගුලාධිකවිදත්ථිමත්තං හොති. තස්ස චොලකස්ස මජ්ඣට්ඨානං මුට්ඨිරතනං හොති. තස්සෙව චොලකස්ස පමාණෙන බිම්බොහනස්ස මජ්ඣට්ඨානම්පි මුට්ඨිරතනං හොතීති විඤ්ඤායතීති.

කම්බලමෙව චතුගුණං වා පඤ්චගුණං වා පක්ඛිපිත්වා කතාපි උණ්ණාභිසිසඞ්ඛෙපමෙව ගච්ඡතීති සමඤ්ඤතො වුත්තත්තා ගොණකාදි අකප්පියං උණ්ණාමයත්ථරණං භිසියං පක්ඛිපිත්වා සයිතුං වට්ටතීති දට්ඨබ්බං. චම්මමයං පන බිම්බොහනං තූලපුණ්ණම්පි න වට්ටතීති විමතිවිනොදනියං වුත්තං. සාරත්ථදීපනියං පන – සීසප්පමාණන්ති යත්ථ ගලවාටකතො පට්ඨාය සබ්බම්පි සීසං උපදහන්ති තං සීසප්පමාණං හොති. තඤ්ච උක්කට්ඨපරිච්ඡෙදතො තිරියං මුට්ඨිරතනං හොතීති දස්සෙතුං යස්ස විත්ථාරතො තිකොණෙසූති ආදිමාහ. මජ්ඣට්ඨානං මුට්ඨිරතනං හොතීති බිම්බොහනස්ස මජ්ඣට්ඨානං තිරියතො මුට්ඨිරතනප්පමාණං හොතීති වුත්තං.”

විනයාලඞ්කාර.

ඉඹුල් ආදි ගස්වලින් ලබා ගන්නා පුලුන්ය, කිරිවැල් ආදි වැල්වලින් ලබා ගන්නා පුලුන් ය, පොටකී තෘණ ආදි යම් කිසි තෘණ වර්ගයක් පිළිබඳ පුලුන් ය (උක් බට ආදියෙන් ලබා ගන්නා පුලුන් ද මෙහිම සඞ්ගෘහීත යි) යන ආදි පුලුන් වර්ගයක් බහා

කරණලද කොට්ට බිම්බොහන නම් වේ. භූතගාම යයි කියන ලද වෘක්ෂලතාතෘණයන් අතුරෙන් කවරක් හෝ පිළිබඳ පුලුන් බිම්බොහන සඳහා ගන්නට වටියි. බිසි පිණිස නම් ඒ සියල්ල ම අකැප යි. බිම්බොහනයෙහි මේ පුලුන් පමණක් නො ව හංස මොනර ආදී සියලු පක්ෂීන්ගේ හා සිංහාදී සියලු සිවුපාවන්ගේ ලොම් ද කැප යි. රුක්මල් ආදී යම් කිසි මල් වර්ගයක් කැප නො වේ. හුදකලා කොල්ලන්කොළ නො වටියි. අන්‍ය කොළ වර්ගයකින් මිශ්‍ර වූයේ වටියි. බිසි පිණිස අනුදන්නාලද එළලොම් ආදී පස්වගය ම බිම්බොහන සඳහා කැප යි. කටියෙහි පටන් හිස දක්වා අඩිශරීරය තැබියහැකි තරම් බිම්බොහන කැප නො වේ. ශීර්ෂප්‍රමාණ වූයේ ම වටියි.

සිවු වන රාශියට අයත් ලොහකුම්භි, ලොහභාණක, ලොහවාරක, ලොහකටාහ, වාසි, ඵරසු, කුඨාරි, කුද්දාල, නිඛාදන යන මොවුන් පිළිබඳ විනිශ්චය මෙසේ දත යුතු යි :–

9. ලොහකුම්භි, 10. ලොහභාණක, 11. ලොහවාරක, 12. ලොහකටාහ.

" ලොහකුම්භි ලොහභාණකං ලොහකටාහන්ති ඉමානි තීණි මහන්තානි වා හොන්තු, ඛුද්දකානි වා, අන්තමසො පසතමත්ත උදකගණ්හනකානිපි ගරුභණ්ඩානියෙව. ලොහවාරකො පන කාලලොහ – තම්බලොහ – වට්ටලොහ – කංසලොහානං යෙන කෙනචි කතො සීහලදීපෙ පාදගණ්හනකො භාජෙතබ්බො. පාදො ච නාම මගධනාළියා පඤ්චනාළිමත්තං ගණ්හාති. තතො අතිරෙකගණ්හනකො ගරුභණ්ඩං. "

සමන්තපාසාදිකා

" ලොහකුම්භි නාම කාලලොහෙන වා තම්බලොහෙන වා යෙන කෙනචි ලොහෙන කතකුම්භි. භාණකන්ති අරඤ්ජරො වුච්චති. "

විනයත්ථමඤ්ජූසා.

" අරඤ්ජරොති බහුඋදකගණ්හනකා මහාචාටි. ජලං ගණ්හිතුං අලන්ති = අරඤ්ජරො. වට්ටචාටි විය හුත්වා ථොකං දීඝමුඛො මජ්ඣෙ පරිච්ඡෙදං දස්සෙත්වා කතොති ගණ්ඨිපදෙසු වුත්තං.

විනයාලඞ්කාර.

කුම්භි – සැළ; අරඤ්ජරසණ්ඨානං – බොහෝ දිය ගන්නා සැළ සටහන්; භාණකං – පාති ද කටාර හෝ තාලි ද කිලිය යි ද යෙත්. පසතමත්තං – පතක් පමණ;

කඞ්ඛාවිතරණී පිටපොත

“කාලලොහ නම් යකඩ යි. කංසලොහ නම් තලි ආදි කරණ කස්ලෝ යි. වට්ටලොහ නම් වැට ආදි කැරැ විරුවා වත් කරණ ලෝ යි. ‘වට්ටලොහනාති පිතවණ්ණං’ යනු විනාශ සන්‍ය යි. සීහලදීපෙ පාදගණ්හනකො – සිංහලවීපයෙහි පස් නැලියක් දිය ගන්නා අතල ය. ‘පාද නම් මගධරටැ ලාසු යෙනි ලහසුමත් ගණ්සි’ යනු කඞ්ඛාවිතරණී සන්‍ය යි. නතො – පස්නැලියක් දිය ගන්නා හෙයින් අඩපසතයකුදු වඩා දිය ගන්නා අතලය.”

කඞ්ඛාවිතරණී පිටපොත.

“සීසතමෙබ මිසෙසත්‍වා කතං වට්ටලොහං. තිපුතමෙබ මිසෙස ත්‍වා කතං කංසලොහං.”

විනයසඞ්ගහ අඪවණ්ණනා.

යකඩ තඹ වටලෝ කස්ලෝ යන මොවුන් අතුරෙන් යම් කිසි ලොහවර්ගයකින් කරණලද සිංහල විපයෙහි පස් නැලියක් දිය ගන්නා ලොහො අතලය වනාහි බෙදිය යුතු යි. පාදය නම් මගධ නැලියෙන් නැලි පසක් පමණ ගන්නේ යි. එයින් අඩපතකුදු වඩා දිය ගන්නා අතලය ගරුභණ්ඩයෙකි.

‘කාලලොහ – තම්බලොහ – කංසලොහ – වට්ටලොහයන් අතු රෙන්’ යන මෙහි කංසලොහය ද වට්ටලොහය ද කෘත්‍රිම ලොහ යි. කෘත්‍රිම ලොහයෝ තුන්දෙනෙකි. කංසලොහය, වට්ටලොහය, ආර කූට ය යි කියා යි. ඔවුනතුරෙහි ඊයම් හා තඹ මිශ්‍ර කොට කරණ ලද්දේ කංසලොහ නම් සුදුඊයම් හා තඹ මිශ්‍ර කොට කරණ ලද්දේ වට්ටලොහ නමි. රසදිය හා තඹ මිශ්‍ර කොට කරණ ලද්දේ ආරකූට (= පිත්තල) නමි. කංසලොහ හා වට්ටලොහ, කෘත්‍රිමලොහ ය යි එහෙයින් කියනලදී.

“ඉමානි තාව පාලියං ආගතානි ලොහභාජනානි. පාලියං පන අනාගතානිපි භිඞ්කාර, පටිග්ගහ, උළුඞ්ක, දබ්බි, කටච්ඡු, පාති, තට්ටක, සරක, සමුග්ග, අඞ්ගාරකපල්ල, ධූමකටච්ඡු ආදීනි ඛුද්දකානි වා මහන්තානි වා සබ්බානි ගරුභණ්ඩානි.”

සමන්තපාසාදිකා.

මොහු වනාහි පාලියෙහි ආ ලොහභාජනයෝ යි. පාලියෙහි නො ආ භිඞ්කාර – ධූමකටච්ඡු ආදි වූ කුඩා වූ හෝ මහත් වූ හෝ සියලු භාණ්ඩයෝ ගරුභණ්ඩ ම වෙත්.

“උද්ධං පන තතො ලොහවාරකො ගරුභණ්ඩකං,
භිඞ්කාරාදීනි සබ්බානි ගරුභණ්ඩානි හොන්ති හි.”

විනයවිනිච්ඡය.

"භිඞ්කාරෙ නාම උක්ඛිත්තහත්ථිසොණ්ඩාකාරෙන කතජල නිග්ගමනනාළිකො උච්චගීවො මහාමුඛඋදකභාජනවිසෙසො."

විනයවිනිච්ඡය ටීකා.

භිඞ්කාර නම් ඔසවනලද ඇත්සොඬක අයුරින් කරණලද දිය නික්මෙන කෙමිය ඇති, උස්කරක් ඇති, මහකටක් ඇති දිය වත් කරණ බඳුන් වෙසෙසකි. = කොතලයයි.)

"භිඞ්කාර – අභිෂිකෙතාදක වත් කරණ කෙඬි බඳු කෙඬි."

කඞ්ඛාවිතරණී පිටපොත.

"ඡ පටිග්ගහ – අත් සෝධන විල්. ("මුව සෝධන්නා වූ මලාව ය" යි එහි ම අන් තැනක ආයේ ය.) උළුඞ්ක – ලූ; දබ්බි – යටුවම්; කටච්ඡු – සැඳි.

කඞ්ඛාවිතරණී පිටපොත.

මෙතන්හි උළුඞ්ක – දබ්බි – කටච්ඡූන්ගේ ප්‍රභෙදය දත යුතු ය. සිංහලභාෂාවෙහි ලූ, සරලු, සැඳි, කොණෙසි යන ආදි නාමයන් ඒ ඒ තන්හි අවිශෙෂයෙන් සැන්දට ව්‍යවහාර කරණලද බව පෙණේ. පාලි 'කටච්ඡු' ශබ්දයෙන් සිංහලට බිඳී එන 'කොණෙසි' සද වෘද්ධව්‍යවහාරයෙහි සැන්දට ම ව්‍යවහාර කළහ.

"පක්කුට්ඨිතං සප්පිං කටච්ඡුනා ආදාය ... ..."

ධම්මපදට්ඨකථා – උත්තරවත්‍ථු.

"කකිය කකියා සිටි තෙලක් අතින් උකා ගන්ට අත දන හෙයින් සැන්දෙකින් උකා ගෙණ ... ... තෙල් සැන්දක් පුරා ගෙණ ... ..."

සද්ධර්මරත්නාවලී.

"කටච්ඡුමත්තම්පි යාගුං වා භත්තං වා න අදාසි."

ධම්මපදට්ඨකථා – ඝොෂකසෙට්ඨිවත්‍ථු.

"සැන්දක් පමණ කැඳ වේව යි, සරලුවක් පමණ බත් වේව යි තුඩුන් විරූ ය."

සද්ධර්මරත්නාවලී.

"සුවණ්ණකටච්ඡුං ආදාය ... ..."

ධම්මපදට්ඨකථා – මෙණ්ඩකසෙට්ඨිවත්‍ථු.

"රන්කොණෙස්සක් හැර ගෙණ" ... ..."

සද්ධර්මරත්නාවලී.

යන ආදි බොහෝ තැන් එයට නිදර්ශන වශයෙන් දක්විය හැක.

ලූ, සරලු දෙසද ම වෘද්ධව්‍යවහාරයෙහි බොහෝ තැන යෙදී තිබෙන්නේ දූන් රටේ "කොණෙස්ස" ය යි කියන දිය වත් කිරීමට ගන්නා සැඳිවෙසෙසට බව පෙණේ.

" භාජනෙ උළුඞ්කං ඔතාරෙත්වා ... ... "

ධම්මපදට්ඨකථා - මහාකස්සපත්ථෙර සද්ධිවිහාරික වත්ථු.

" සරලුව සැළ ඔබා බලා ... ... "

සද්ධර්මරත්නාවලී.

" උළුඞ්කෙන ගුළං උපනාමෙසි. "

පපඤ්චසූදනී - උපාලිසුත්ත වණ්ණනා.

" ලුවින් අසුචි ගෙණ එළලිය. "

අමාවතුර.

" උළුඞ්කයාගුමපි කටච්ඡුභික්ඛම්පි න ලභති. "

පපඤ්චසූදනී = අඞ්ගුලිමාලසුත්තවණ්ණනා.

" ලුවක් හඹුදු කෙණෙස්සක් බතුදු නො ලැබෙති. "

අමාවතුර.

" උළුඞ්කෙන කඤ්ජියං හරාපෙත්වා - ලුවින් කැඳ ඉස්වා පියා. "

ධම්පියා ගැටපදය.

යන ආදිය එයට සාධක යි.

' උදඞ්චන ' යනු ද එයට ම පර්‍ය්‍යායනාමයෙකි.

ධම්මපදට්ඨකථාවේ අග්ගසාවකවත්ථුවේ " තස්ස මෙ අත්තෙන වාසිභාවො චාටියා උදඞ්චනභාවප්පත්ති විය හොති, " යන්නට ධම්පියා ගැටපදයෙහි මෙසේ දක්වූහ :– " සැළට ලුබව් පැමිණීමක් වැනි ... ... අජර බැවින් ගැළවී අතැවැසි විම් සැළ බැවින් ගැළවී දිය ඉස්නා ලු වීමක් වැන්නැ යි සේ යි. උදඞ්චන ශබ්දයෙන් උළුඞ්ක වාරකාදි දිය ඉස්නා වළඳ කියනු " යනු එයට සාධක යි.

දැන් ඉතිරි ව ඇත්තේ " දබ්බී " යන්න පමණ යි. එය කටච්ඡු, උළුඞ්ක ශබ්දයන් පමණ භාෂාව්‍යවහාරයෙහි ආයේ ද නොවේ. " දබ්බී '' යන්නට " ව්‍යඤ්ජන බෙදන හැන්ද ය " යි ඇතැම් ආචාර්‍ය්‍ය කෙණෙකුන් අර්ථ කියන බව දනුම්හ. ඔවුන්ට ඒ පිණිස ඉවහල් වූයේ –

" යාවජීවම්පි චෙ බාලො – පණ්ඩිතං පයිරුපාසති,
න සො ධම්මං විජානාති – දබ්බී සූපරසං යථා.

ධම්මපදට්ඨකථා - උදායිත්ථෙරවත්ථු.

යන ගාථාව ය යි හඟිමු.

" කොතෙක් දවසුත් බත් මාලු බෙදූ හැන්ද බත් මාලුවේ රස නො දන්නා මෙනි. " යනු ඒ පිළිබඳ සද්ධර්මරත්නාවලී වාක්‍යයෙකි. එයින් හැඟෙන්නේ බත් මාලු දෙක ම බෙදීමට එක් හැන්ද ම යොදන බව යි. දනුදු එහි මහත් විශෙෂයක් ඇති බව නො පැණේ. එහෙයින් " දබ්බී " යනු " ව්‍යඤ්ජන බෙදන හැන්ද '' ය යි

විශෙෂයක් කිරීමට තරම් සාක්ෂ්‍ය ඇද්දැ යි නො දනුම්හ. කඞ්ඛාවිතරණී පිටපොතේ ආ අර්ථය වූ "යටුවම්" යන්න ගැණ ද මඳක් දුර සැලකිය යුතු ය.

"එක් සක්වළෙහි මහපස් පොළොව දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් පමණ බොල ඇත්තේ යැ. ඒ පස් පොළොව රැඳ වූ – පෙ – වා පොළොව නවලක්ෂ සැටදහසක් යොදුන් පමණ බොල ඇත්තේ යැ යි තමන්ගේ නුවණින් යටුවම් කොට පිරිසිඳ දත් බුදුන් ... "

බුත්සරණ.

"කෙසේ වි නමුත් මට සැක ඇත්තව ද, යටුවම් කරණ අමාත්‍යයාත් යහපත් කොට කුරුධර්මය රක්ෂා කරන්නේ ය. ... ...

එක් දවසක් තමන්ගේ ජනපදයේ කෙත් යටුවම් කරන් නාහු ... ... "

පන්සියපණස් ජාතකපොත.

මේ ස්ථානයන්හි 'යටුවම්' යනුවෙන් දක්වන ලද්දේ යෂ්ටි කර්මය (=ඉඩම් ආදිය මැනීම) යි. යටුවම් කරණ අමාත්‍යයා නම් මිනින්දෝරු තැන ය. බත් මාලු බෙදීමට නො ව පිසන කල ඇලළිමට උණලී ආදියෙන් කරණලද පත්තක් යොදන බව පෙණේ. ඒව නම් "යෂ්ටි" ය යි කිවහැක. එසේ වුව ද ඒට 'යටුවම්' යි කීමෙන් පලක් නැත. එහෙත් යටුවම් පිණිස ගන්නා උපකරණය ද උපචාරවිධියෙන් 'යටුවම්' යි කිය හැකි බැවින් මෙහි එසේ ගන්නා ලද දැ යි නො දනුම්හ. එසේ ගතහොත් 'දබ්බි' යනු පත්තක් හෝ එබඳු උපකරණ විශෙෂයකි. ඒ කෙසේ වුවත් "දබ්බි සූපරසං යථා" යන තැන නම් දබ්බි ය යි කියේ අවිශෙෂයෙන් බත් මාලු බෙදන හැන්දට යි. සුධීහු පරීක්ෂා කෙරෙත්වා.

"පාති – තලි; කටච්ඡු – තැටි;"

කඞ්ඛාවිතරණී පිටපොත.

"සරකොති මජ්ඣෙ කූටං දස්සෙත්වා මුඛවට්ටිං විත්ථතං කත්වා පිට්ඨිතො නාමෙත්වා කතභාජනං."

විනයසඞ්ගහ අළුවණ්ණනා.

"සරක – කට්ටෝරම් හෙවත් මලා; සමුග්ග – වෘත්තාකාර කරඬු; අඞ්ගාරකපල්ල – වක්ගිනිකබල්; ධූමකටච්ඡු – ගන්ධිකයන් ගේ දුමොළොසු වැනි දුමොළොසු."

කඞ්ඛාවිතරණී පිටපොත.

"අයපත්තො, අයථාලකං, තම්බලොහථාලකන්ති ඉමානි පත භාජනියානි. කංසලොහවට්ටලොහභාජනවිකති සඞ්ඝිකපරිභොගෙන වා ගිහිවිකතා වා වට්ටන්ති. පුග්ගලිකපරිභොගෙන න වට්ටන්ති. කංසලොහාදිභාජනං සඞ්ඝස්ස දියමානම්පි හි පාරිහාරියං න වට්ටති. ගිහිවිකතනීහාරෙනෙව පරිභුඤ්ජිතබ්බන්ති මහාපච්චරියං වුත්තං."

සමන්තපාසාදිකා.

“ කංසලොහ – කස්ලොහො ද, වට්ටලොහ – වැට ආදියට ගත්තා වට්ටලොහය ද යන මෙයින් කරණලද; භාජනවිකතී – භාජනවිකෘතීහු; ගිහිවිකටා වා – ගෘහස්ථයන් සතු වූවාහු හෝ. ”

කඞ්ඛාවිතරණී පිටපොත.

“ සඞ්ඝිකපරිභොගෙනාති ආගන්තුකානං වුඩ්ඪතරානං දත්වා පරිභොගෙන. පුග්ගලිකපරිභොගෙන න වට්ටතීති ආගන්තුකානං අදත්වා අත්තනො සන්තකං විය ගහෙත්වා පරිභුඤ්ජිතුං න වට්ටති. ”

විනයසඞ්ගහ අට්ඨවණ්ණනා.

සාංඝික පරිභොගයෙන් ය යනු ආගන්තුකව පැමිණි වැඩි මහල්ලන්ට දී පරිභොග කිරීමෙන් ය යනු යි. පෞද්ගලික පරිභොගයෙන් නො වටී යි යනු ආගන්තුකයන්ට නො දී තමන් සතු දෙයක් මෙන් ගෙණ පරිභොග කරන්නට නො වටී යනු යි.

“ ගිහිවිකට නීහාරෙනෙව පරිභුඤ්ජිතබ්බානීති ඉමානි සචෙ ආරාමිකාදයො පටිසාමෙත්වා පටිදෙන්ති පරිභුඤ්ජිතුං වට්ටතීති දස්සෙති. ”

සාරත්ථදීපනී.

“ ඨපෙත්වා පන භාජනවිකතිං අඤ්ඤම්පි කප්පියලොහභණ්ඩ අඤ්ජනී, අඤ්ජනීසලාකා, කණ්ණමලහරණී, සූචි, පණ්ණසූචි, ඛුද්දකො පිප්ඵලකො, ඛුද්දකං ආරකණ්ටකං, මුද්දිකා, කුඤ්චිකා, තාලකං, කත්තරයට්ඨිවෙධකො, නත්ථුදානං, භෙණ්ඩිවාලො, ලොහකූටො, ලොහකට්ඨී, ලොහගුළො, ලොහපිණ්ඩි, ලොහචක්කලිකං, අඤ්ඤම්පි විප්පකතලොහභණ්ඩං භාජනීයං. ”

සමන්තපාසාදිකා.

“ (භාජන විකෘතීන් හැර) අඤ්ඤම්පි කප්පිය – අනාමාස ලොහො හැර කැප වූ; ලොහභණ්ඩ – ලොහ පරිෂ්කාරයෙහි; භාජනීයං – භාජනීය වස්තු කියම්හ යි සේයි. යට කී කංසලොහ වට්ටලොහ තම්බලොහාදි ලොහ හා මෙ සියල්ල අකප්පියජාතරූප රජතාදියට අන්‍ය හෙයින් අඤ්ඤම්පි කප්පියලොහභණ්ඩ යනු මෙයින් ගත්හු. අඤ්ජනී – අඳුන් නළ; අඤ්ජනීසලාකා – අඳුන් ලා; කණ්ණමලහරණී – කන් සැඳි; සූචි – හිඳිකටු ය. ”

කඞ්ඛාවිතරණී පිටපොත.

“ පණ්ණසූචි නාම ලෙඛනීති මහාගණ්ඨිපදෙසු වුත්තං. ”

පාලිමුත්තක විනය විනිච්ඡය සඞ්ගහ ටීකා.

“ පණ්ණසූචි නාම ලෙඛනීති වදන්ති. ”

විනයාලඞ්කාර.

“ පණ්ණසූචි – පන්හිඳ ය යනු හෙළ කඞ්ඛාවිතරණීයි. ”

කඞ්ඛාවිතරණී පිටපොත.

"ඛුද්දකොපි – කුඩා ද වූ; පිප්ඵලකො – කතුරු ය;"

කඞ්ඛාවිතරණී පිටපොත.

"ආරකණ්ටකන්ති සූචිවෙධනකං."

විනයසඞ්ගහ අත්ථවණ්ණනා.

"ආරකණ්ටක නම් ඉදිකටු විදිනා කටුව යි; "ආරකණ්ටකං – හිදිවිය ය;"

කඞ්ඛාවිතරණී පිටපොත.

"මුද්දිකා – යතුරු මුන්ද ය; (මෙය සමන්තපාසාදිකාවෙහි නො ආයේ ය.) කුඤ්චිකා – කෙස්ස ය; තාලකං – යතුරු ය;"

කඞ්ඛාවිතරණී පිටපොත.

"කත්තරයට්ඨිවෙධකොති කත්තරයට්ඨිවලයං."

වින‍යසඞ්ගහ අත්ථවණ්ණනා.

කත්තරයට්ඨිවෙධකය නම් සැරයටිවලල්ල (=පිල්ල) යි.
"කත්තරයට්ඨිවෙධකො – සැරයටිපිලිය ය;"

කඞ්ඛාවිතරණී පිටපොත.

"නත්ථුදානං – නැහැහොරු ය (=නස්‍යය පිණිස බෙහෙත් වත්කරණ උපකරණය); හෙණ්ඩිවාලකො – පාරුවලල්ල ය;"

කඞ්ඛාවිතරණී පිටපොත.

"අඤ්ජනී – පෙ – හෙණ්ඩිවාලකො යථා තථා වා ඝනකත ලොහං විප්පකතලොහභණ්ඩඤ්ච සබ්බං භාජනීයං."

කඞ්ඛාවිතරණී.

"යථා තථා – යම්තම් පරිද්දෙකින්; ඝනකතලොහං – ඝන කොට කරණලද ලොවට ය; විප්පකතලොහභණ්ඩඤ්ච – නො නිමාවූ ලොහභාණ්ඩ ද යන; සබ්බං – මෙ සියල්ල; භාජනීයං."

කඞ්ඛාවිතරණී පිටපොත.

ලොහකූට, ලොහකට්ඨි, ලොහගුළ, ලොහපිණ්ඩි, ලොහචක්කලික යන නාමයන්ගෙන් සමන්තපාසාදිකාවෙහි ආ භාණ්ඩ කඞ්ඛාවිතරණීයෙහි ඝනකත ලොහ නාමයෙන් පිඬු කොට දක්වන ලදී. "යථා තථා වා ඝනකතං ලොහන්ති ලොහකට්ඨි, ලොහගුළො, ලොහපිණ්ඩි, ලොහචක්කලිකන්ති එවං ඝනකතං ලොහං" යනු එහෙයින් විනයත්ථමඤ්ජූසාවෙහි කියනලදී.

"ධූමනෙත්තඵාලකදීපරුක්ඛදීපකපල්ලිකාඔලම්බකදීපඉත්ථිපුරිස තිරච්ඡානරූපකානි පන අඤ්ඤානි වා භණ්ඩානි භිත්තිච්ඡදනකවාටාදිසු උපනෙතබ්බානි. අන්තමසො ලොහඛිලකං උපාදාය සබ්බානි ලොහභණ්ඩානි ගරුභණ්ඩානියෙව හොන්ති. අත්තනා ලද්ධානිපි පරිහරිත්වා පුග්ගලිකපරිභොගෙන න පරිභුඤ්ජිතබ්බානි. සඞ්ඝික පරි

භොගෙන වා ගිහිවිකටානි වා වට්ටන්ති. තිපුභණ්ඩම්පි එසෙව නයො. ”

සමන්තපාසාදිකා.

“ ධූමනෙත්තන්ති ධූමනාලිකා; අත්තනා පටිලද්ධම්පීති අත්තනා පටිලද්ධම්පි තං ලොහභණ්ඩං කිඤ්චාපි පුග්ගලිකපරිභොගෙන පරිභුඤ්ජිතබ්බන්ති යොජනා. ”

විනයවිනිච්ඡය අත්ථවණ්ණනා.

“ ධූමනෙත්ත – දුම්නල; ථාලක – සීවැල්; දීපරුක්ඛ – පහන් රුක හෙවත් වැට සි සේ සි; දීපකපල්ලිකා – පහන්කබල; අත් වැට ද එහි මැ ඇතුළත් වේ. බලම්බකදීප – එල්වන වැට ද මෙ ගරුභණ්ඩානි යනු හා සම්බන්ධ කරණු. ඉත්ථිපුරිසතිරච්ඡාන රූපකානි – ස්ත්‍රීපුරුෂතිරච්ඡාන රූපකයෝ ද; අඤ්ඤානි වා භණ්ඩානි – සෙසු ලොහභාණ්ඩයෝ; භිත්තිච්ඡදනකවාටාදිසු – භිත්තිච්ඡදනයෙහි ද දෙර කවුළුයෙහි ද; උපනෙතබ්බානි – එළවිය යුත්තෝ සි. “ අන්තමසො ලොහබීලකං උපාදාය භිත්තිච්ඡදනකවාටාදිසු උපනෙතබ්බානි අඤ්ඤානි වා සබ්බානි ලොහභණ්ඩානි ” යි සම්බන්ධ සි. අන්තමසො – අඩමානතයෙන්; ලොහබීලකං උපාදාය – පුඩු ඇණ පටන් සියල්ල ගරුභණ්ඩ සි. ගිහිවිකටානි වා – ගෘහස්ථයන් සන්තක වූවාහු හෝ; වට්ටන්ති – වටිත්. යට කියනලද ධූමනෙත්තාදි සියල්ල තමා සතු කොට ලදහොත් සාඞ්ඝික කොට හෝ ගෘහස්ථයන් සතු කොට හෝ වැළඳ ගත යුතු. සාඞ්ඝික වැ ලද්දෙය නිසා නො වේ. සාඞ්ඝික වී නම් ගිහිවිකටානි යනු අයුක්ත සි. තිපුභණ්ඩම්පි එසෙව නයො – තුඹයෙන් (=ඊයමින්) කරණලද දෙයෙහි ද ලොහභාණ්ඩයට කී නය මැ සි.”

කඞ්ඛාවිතරණී පිටපොත.

“ ඛීරපාසාණමයානි තට්ටකසරකාදීනි ගරුභණ්ඩානියෙව. ඝටකො පන තෙලභාජනං වා පාදගණ්හනකතො අතිරෙකමෙව ගරුභණ්ඩං. සුවණ්ණරජතආරකූටජාතිඵලිකභාජනානි ගිහිවිකටානිපි න වට්ටන්ති. සෙනාසනපරිභොගෙ පන ආමාසම්පි අනාමාසම්පි සබ්බං වට්ටති. ”

කඞ්ඛාවිතරණී.

“ ඛීරපාසාණමයානීති මුදුකඛීරවණ්ණපාසාණමයානි ගිහිවිකටානිපි න වට්ටන්ති අනාමාසත්තා. පිසද්දෙන පගෙව සඞ්ඝිකපරිභොගෙන වා පුග්ගලිකපරිභොගෙන වාති දසෙති. සෙනාසනපරිභොගෙ පන සබ්බකප්පියො. තස්මා ජාතරූපාදිමයා සබ්බෙපි සෙනාසනපරික්ඛාරා ආමාසා. තෙනාහ : “ සෙනාසනපරිභොගෙති ආදි. ”

විනයත්ථමඤ්ජූසා.

“ඛීරපාසාණමයානි - ක්ෂීරපාෂාණයෙන් (= කිරිගරුඬ ගලින්) කරණලද; තට්ටිකා - තැටි; සරකාදීනි - මලා ආදීහු; ගරුභණ්ඩානියෙව - ගරුභණ්ඩයෝ මැ යි. ඛීරපාසාණ නම් මොලොක් පහණ යි. ඝටකො - පැන් ගන්නා කළය ද; තෙලභාජනං වා - තෙල් වත් කොට තබන්නා වූ භාජනය ද; පාදගණ්හනකතො යි භික්ෂුනට සාරුප්ප හෙයින් කීහු. මෙ දෙක ඛීරපාසාණය යි දත යුතු. සුවණ්ණ - රත්රන්; රජත - රිදී; ආරකූට - අරළුලෝ; ජාතිඵලිකභාජනානි - දූවාණ (= පළිඟු) මය භාජනයෝ; අනාමාස හෙයින් ගිහිවිකට වුවාහුත් නො වටිත්. සෙනාසනපරිභොගෙ පන - සෙනාසනපරිභොගයෙහි වනාහි; ආමාසම්පි - කංසලොහාදි ඇල්ලිය හැකි දෑ ද, අනාමාසම්පි - රත්රන් ආදි වූ නො ඇල්ලිය හැකි දෑ ද; සබ්බං වට්ටති - සියල්ල වටී.”

කඞ්ඛාවිතරණී පිටපොත.

“ඛීරපාසාණමයානීති මුදුකඛීරවණ්ණපාසාණමයානි. ඝටකොති ඛීරපාසාණමයොව වාරකො. හාරකූටන්තිනාම සුවණ්ණවණ්ණලොහං. ජාතිඵලිකෙන උබ්භතං ජාතිඵලිකමයං. සෙනාසනපරිභොගෙ පන සබ්බකප්පියො. තස්මා ජාතරූපාදිමයා සබ්බාපි සෙනාසනපරික්ඛාරා ආමාසා.”

විනයවිනිච්ඡය අභිනවණ්ණනා.

ඛීරපාසාණමය නම් මොලොක් කිරිගරුඬ ගලින් කරණ ලද්ද යි. මෙහි පැන් ගන්නා කළය ද කිරිවන් ගලින් කරණ ලද්ද ම ගත යුතු යි. හාරකූට නම් සවර්ණ වර්ණ ලොහයෙකි. (පිත්තල යි.) දූවානයෙන් (= පළිඟුයෙන්) කරණ ලද්දේ ජාතිඵලිකමය නම් වේ. සෙනාසනපරිභොගයෙහි වනාහි සියල්ල කැප යි. එහෙයින් ජාතරූපාදිමය වූ සියලු සෙනාසනපරික්ඛාරයෝ ආමාසයෝ යි.

13. වාසි.

“වාසිආදිසු යාය වාසියා දන්තකට්ඨච්ඡෙදනඋච්ඡුතච්ඡනමත්තතො අඤ්ඤං මහාකම්මං කාතුං න සක්කා අයං පන භාජනියා. සෙසා යෙන කෙනචි ආකාරෙන කතා ගරුභණ්ඩා.”

කඞ්ඛාවිතරණී.

“වාසිආදිසු - වෑ පොරෝ ඈ පරිෂ්කාරයෙහි විනිශ්චය කියම්හ යි සේ යි. දන්තකට්ඨච්ඡෙදන - දැහැටි දඬු කැපීම් මාත්‍රයෙන් ද; උච්ඡුතච්ඡනමත්තතො - උක්දඬු සස්නා මාත්‍රයෙන් ද; අඤ්ඤං මහාකම්මං - ගස් කැපීම් ආදි වූ අනෙක් මහා කර්මාන්තයක්; යාය වාසියා කාතුං න සක්කා යි යොදනු. (යම් වෑයකින් කරන්නට නො හැක්කේ ද එය වනාහි බෙදිය යුතු ය.) යෙන

යෙනකෙනචි ආකාරෙන - යම් කිසි ආකාරයෙකින්; කතා - කරණ ලද; සෙසා වාසි ගරුභණ්ඩා සි යොදනු. (සෙසු වෑහෑය ගරු භණ්ඩ ම වේ.)

කඞ්ඛාවිතරණී පිටපොත.

මෙහි දක්වූ වෑහෑය කුමක් ද යි කියාත් මතභෙදයක් පවතී. මේ වෑහෑය නම් දෑළිපිහිය නො වේ. දෑහැටි දඬු කැපිය හැකි වුද උක් දඬු සැස්ස හැකි වූ ද වෑහෑය බෙදා ගත යුතු බවත් ගස් කැපීම් ආදි අතික් මහා කර්මාන්ත කටහැකි වෑහෑය ගරු භණ්ඩ වන බැවින් නො බෙදිය යුතු බවත් මෙහි දක්වන ලදී. හිසකේ කපන දෑළිපිහියෙන් දෑහැටි දඬු කැපීම්, උක් දඬු සැසීම් ආදිය කළ කල්හි නැවත එයින් හිසකේ කැපීමකුත් කළ හැකි වේ ද? ගස් කැපීම් ආදි මහා කර්මාන්ත කටහැකි දෑළිපිහියා කොයි රටේ තිබේ ද? එහෙයින් මේ වෑහෑය නම් දෑළිපිහිය නො වන බව නිශ්චය වේ.

දෑළිපිහියට " වාසි " යන නාමයකුදු පාලි භාෂාවේ අප්‍රසිද්ධ ය. ඛුර, ඛුරසිපාටිකා, න භික්ඛවෙ නහාපිතපුබ්බකෙන ඛුරභණ්ඩං පරිහරිතබ්බං, ඛුරගෙහයෙව අරහත්තං පාපුණි යන ආදි බොහෝ තන්හි පැණෙන ඛුර ශබ්දය ම දෑළිපිහිය සඳහා ව්‍යවහෘත බවත් සිංහල භාෂාවෙහු දු කරය, කරගල, කරකොපුව, කරගෙහි ම රහත් බවට පැමිණියේ ය යන ආදි තන්හි පැණෙන ඛුර ශබ්දයෙන් බිඳී ආ ' කර ' යන්න එයට සාක්‍ෂ්‍ය වශයෙන් වැඩිදුරටත් ඉදිරිපත් කළහැකි බවත් සැලකිය යුතු යි.

එසේ වී නම් මෙහි ' වෑහෑ ය ' කවරේ ද යි නිශ්චයට යායුතු ය. දූන් වෑය ය යි ව්‍යවහාර කරණු ලබන භාණ්ඩය හා ලොකු කුඩා පිහියා ද මෙයින් ගතයුතු බව හැගේ. දෑහැටි දඬු කැපීම් ආදි සුළු කර්මාන්ත පමණක් කළහැකි කුඩා පිහියා බෙදාගත යුතු බවත් ලොකු පිහියා හා වෑ, ගරු භණ්ඩ වන බවත් එකල නිශ්චය වේ. වෑහෑය යන්නෙන් පිහියා ගතයුතු බවට තවත් වැදගත් සාක්‍ෂ්‍ය යක් ඇත. එනම්, මේ ගරු භණ්ඩ විනිශ්චය කථාවෙහි භික්‍ෂු නමක් හට අතිශයින් ප්‍රයොජනවත් භාණ්ඩයක් වූ පිහිය ද ඇතුළත් විය යුතු ම ය. එය විශෙෂ නාමයකින් ඇතුළත් නො කරණලද බැවින් හා දෑහැටි දඬු කැපීම් ආදි ක්‍රියාවන්ට ප්‍රයොජනවත් ය යි කී බැවින් ද ' වාසි ' යන්නෙන් ම එය සඞ්ගෘහීත ය යි හැගේ.

අවපිරිකරව අයත් ' වාසි ' ය දෑළිපිහිය ම ය යි නිශ්චය කොට ගතහොත් කරනැවෑමි කුලයෙන් පැවිදි වූවන්ට අටපිරිකරක් නො ලැබේ. " න භික්ඛවෙ නහාපිතපුබ්බකෙන ඛුරභණ්ඩං පරිහරිතබ්බං " යන්නෙන් " මහණෙනි, පෙර කරනැවෑමි වූවහු

විසින් කරබඩු පරිකරණය නො කටයුතු ය " යි වදාළ බැවින් දැඩි පිහිය පාවිච්චි කරන්නට ඔවුන්ට අවකාශයක් නැත. එකල්හි ඔවුන්ට ලැබෙන්නේ සත්පිරිකරක් පමණකි.

14. ඵරසු.

" ඵරසු පන අන්තමසො වෙජ්ජානං සිරාවෙධකොපි ගරුභණ්ඩමෙව. "

සමන්තපාසාදිකා.

" **ඵරසු පන** – පොරෙව වනාහි; **අන්තමසො** – යටත්පිරිසෙයින්; **වෙජ්ජානං** – වෙදුන්ගේ; **සිරාවෙධකොපි** – සිරාවෙධය ද; සිරා (= නහර) විදිනා කටුව ද; ගරු භණ්ඩ මැ යි. "

කඞ්ඛාවිතරණී පිටපොත.

15. කුඨාරි.

" තථා කුඨාරි. යා පන ආයුධසඞ්ඛෙපෙන කතා අයං අනාමාසා. "

කඞ්ඛාවිතරණී.

" කුඨාරියා ඵරසුසදිසො එව විනිච්ඡයො. "

සමන්තපාසාදිකා.

" **කුඨාරි පන** – කෙටේරිය ද; " තථා ගරුභණ්ඩමෙව " යි යොදනු. " යා පන කුඨාරි ආවුධසඞ්ඛෙපෙන කතා අයං අනාමාසා " යි යොදනු. "

කඞ්ඛාවිතරණී පිටපොත.

16. කුදාල. 17. නිඛාදන.

" කුදාලො අන්තමසො චතුරඞ්ගුලමත්තොපි ගරුභණ්ඩමෙව. නිඛාදනං චතුරස්සමුඛං වා හොතු දොණිමුඛං වා වඞ්කං වා උජුකං වා අන්තමසො සම්මුඤ්ජනිදණ්ඩකවෙධනම්පි දණ්ඩබද්ධං චෙ ගරුභණ්ඩමෙව. සම්මුඤ්ජනිදණ්ඩඛණනකම්පන අදණ්ඩකං ඵලමත්තමෙව යං සක්කා සිපාටිකාය පක්ඛිපිත්වා පරිහරිතුං භාජනීයං. "

සමන්තපාසාදිකා.

" කුදාලො දණ්ඩබද්ධනිඛාදනං වා අගරුභණ්ඩං නාම නත්ථි. සම්මුඤ්ජනිදණ්ඩඛණනකම්පන යං සක්කා සිපාටිකාය පක්ඛිපිත්වා පරිහරිතුං තං භාජනීයං. "

කඞ්ඛාවිතරණී.

" **කුදාලො** – හුදැල්ල ද; **දණ්ඩබද්ධනිඛාදනං** – මිට ඇත්තා වූ නියන් ද; **අගරුභණ්ඩං නාම නත්ථි** – අගරුභණ්ඩ නම් දෙයෙක් නැති. **සම්මුඤ්ජනිදණ්ඩඛණනකම්පන** – මුසුන්දඬු විදිනා කටුව වනාහි; **අදණ්ඩකං** – දඬු නැත්තේ; **ඵලමත්තමෙව** – ඵලමාත්‍ර වූයේ ම; දඬු නැති වැ කටුව මැ ය යි සේ යි. යං සම්මුඤ්ජනි

දණ්ඩබණ්ණනකං – මුසුත් දඬු විදිනා යම් කටුවෙක්; සිපාටිකාය පක්ඛිපිත්වා සක්කා පරිහරිතුං තං භාජනීයං යි යොදනු. (කර කොපු වෙහි බහා පරිහරණය කරන්නට හැකි නම් එය බෙදිය යුතු යි.) සිපාටිකා නම් කර වියල්ල යි. "

කඞ්ඛාවිතරණී පිටපොත.

"සිඛරම්පි නිඛාදනෙනෙව සඞ්ගහිතං."

කඞ්ඛාවිතරණී.

"සිඛරම්පන දණ්ඩබද්ධනිඛාදනං අනුලොමෙතීති ආහ : 'සිඛරම්පි නිඛාදනෙනෙව සඞ්ගහිත'න්ති. සචෙ තම්පි පන අදණ්ඩකං ඵලමත්තං භාජනීයං."

විනයත්ථමඤ්ජූසා – විනයසඞ්ගහ අත්ථවණ්ණනා.

සිඛරම්පි – තොරපනය ද; **නිඛාදනෙනෙව සඞ්ගහිතං** – දණ්ඩබද්ධනිඛාදනයට මැ අනුලොම්.

කඞ්ඛාවිතරණී පිටපොත.

හෙ ද මිට නැති ව කටුව පමණක් වූයේ බෙදිය යුතු යි.

"යෙහි මනුස්සෙහි විහාරෙ වාසිආදීනි දින්නානි හොන්ති තෙ චෙ ඝරෙ දඩ්ඪෙ වා විලුත්තෙ වා 'දෙථ නො භන්තෙ උපක්ඛරෙ පුන ආහරිත්වා දෙම්මා'ති වදන්ති දාතබ්බානි. සචෙ හරන්ති න වාරෙතබ්බා. අනාහරන්තාපි න චොදෙතබ්බා "

කඞ්ඛාවිතරණී.

" උපක්ඛරෙති වාසිආදිභණ්ඩානි."

විනයත්ථමඤ්ජූසා.

"යෙහි මනුස්සෙහි – යම් මිනිස් කෙණකුන් විසින්; විහාරෙ – විහාරයෙහි ද; වාසිආදීනි දින්නානි හොන්ති – වෑ පොරෝ ආදි වූ පරිෂ්කාරයෝ දෙන ලද්දාහු වෙද්ද; ඝරෙ දඩ්ඪෙ වා – ගෙය දා ගිය කල්හි හෝ; විලුත්තෙ වා – හසති ආදීන් විසින් බිඳ පූ කල්හි හෝ; භන්තෙ – වහන්ස; නො – අපට; උපක්ඛරෙ – වාසි ආදි පරිෂ්කාරයන්; දෙථ – දුන මැනව. පුන ආහරිස්සාමාති – නැවත ගෙණෙම්හ යි; තෙ චෙ වදන්ති – ඉදින් දුන් ඒ මනුෂ්‍යයෝ කියද්ද; දාතබ්බානි – වාසි ආදි ඒ පරිෂ්කාරයෝ දියයුත්තෝ ය යි මෙසේ යොදා අර්ථ බිණියයුතු."

කඞ්ඛාවිතරණී පිටපොත.

ඉදින් ඒ වාසි ආදි පරිෂ්කාරයන් දුන් මිනිස්සු ගෙණයෙද් ද නො වැළැක්විය යුතු යි. නැවත පෙරළා ගෙණ නො එන්නාහු ද චොදනා නො කටයුත්තාහ.

"කම්මාර – රථකාර – තච්ඡකාර – චුන්දකාර – නළකාර – මණිකාරපත්තබන්ධකානං අධිකරණී – මුට්ඨි – සණ්ඩාස – තුලාදීනි සබ්බානි ලොහමයඋපකරණානි සඞ්ඝෙ දින්නකාලතො පට්ඨාය ගරුභණ්ඩානි."

සමන්තපාසාදිකා – කඞ්ඛාවිතරණී.

"පත්තබන්ධකො නාම පත්තස්ස ගණ්ඨිකාදිකාරකො. පටිමානං සුවණ්ණාදිපත්තකාරකොතිපි වදන්ති."

විනයත්ථමඤ්ජූසා.

"පත්තබන්ධකා නාම පත්තස්ස ගණ්ඨිකාරකා. සුවණ්ණාදිපත්තකාරකාතිපි වදන්ති."

විනයසඞ්ගහඅත්ථවණ්ණනා.

"කම්මාර – කම්බුරහ; (රථකාර – රියවඩුවහ;) තච්ඡකාර – ලොහොකරුවහ; චුන්දකාර – ලාසු වඩුවහ (ලියන වඩුවහ); නලකාර – කුළුපත්තහ; මණිකාරයෝ නම් මැණික් විදිනා මැණික් සැට්මර යි. පත්තබන්ධකයෝ නම් යපත් විදිනෝ යි. යපත් විදිනෝ නම් බුන් පාත්‍ර බඳනා හැවි කෙණෙක් ලු. "පත්තබන්ධකො නාම පත්තස්ස ගණ්ඨිආදිකාරකො, පටිමානං සුවණ්ණාදි පත්තකාරකොතිපි වදන්ති" යනු වජ්‍රබුද්ධි යි. (ඔවුන්ගේ) අධිකරණී – කිණිහිරි; මුට්ඨි – මිටි; සණ්ඩාස – හඬුව; තුලාදීනි – තරාදිය ආදි වූ සබ්බානි ලොහමයඋපකරණානි – සියලු ලොහමය උපකරණයෝ; සඞ්ඝස්ස – සඞ්ඝයා කෙරෙහි; දින්නකාලතො පට්ඨාය – දුන් තැන පටන් කොට; ගරුභණ්ඩානි – ගරුභණ්ඩයෝ යි.

කඞ්ඛාවිතරණී පිටපොත.

"තිපුකොට්ටකසුවණ්ණකාරචම්මකාරඋපකරණෙසුපි එසෙව නයො. අයං පන විසෙසො. තිපුකොට්ටකඋපකරණෙසු තිපුච්ඡෙදනකසත්ථං, සුවණ්ණකාරඋපකරණෙසු සුවණ්ණච්ඡෙදනකසත්ථං, චම්මකාරඋපකරණෙසු කතපරිකම්මචම්මච්ඡින්දනිකා ඛුද්දිකා සත්ථිකා ඉමානි භාජනීයානි. නහාපිතතුන්නකාරඋපකරණෙසුපි ඨපෙත්වා මහාකත්තරිං මහාසණ්ඩාසං මහාපිප්ඵලකං ච සබ්බං වට්ටති. ඉතරානි ගරුභණ්ඩානි."

සමන්තපාසාදිකා – කඞ්ඛාවිතරණී.

"තිපුච්ඡෙදනකසත්ථං සුවණ්ණච්ඡෙදනකසත්ථං කතපරිකම්මචම්මච්ඡින්දනිකා ඛුද්දිකා සත්ථිකා ඉමානි වෙළු තීණි පිප්ඵලකං අනුලොමෙන්තීති ආහ 'අයම්පන විසෙසො' ති ආදි."

විනයත්ථමඤ්ජූසා.

"තිපුකොට්ටක – තුඹු සිඳුනහ; සුවණ්ණකාර – තරලහ; චම්මකාර – සොම්මරහ; (යන මොවුන්ගේ උපකරණයන්හි දු මෙ මැ නය යි.) අයං පන විසෙසො – මෙ අප මතු කියන්නේ වෙනසෙකි. තිපුච්ඡෙදනකසත්ථං – තුඹු (= ඊයම්) කපන්නා වූ ශස්ත්‍රය ද; සුවණ්ණච්ඡෙදනකසත්ථං – රන් කපන්නා වූ ශස්ත්‍රය ද; කතුරු යි; කතපරිකම්මචම්ම – කරණලද චිත්‍රකම් ඇති චර්මය; ඡින්දනිකා ඛුද්දිකා සත්ථිකා – කපන්නා වූ කුඩා කැත්ත ද කියත ද යන; ඉමානි භාජනීයානි – මොහු බෙදිය යුත්තෝ යි.

නහාපිතතුන්නකාරඋපකරණෙසුපි – කරනැවෑමි සන්නාලින්ගේ උපකරණයෙහි දු; මහාකත්තරිං මහාසණ්ඩාසං මහාපිප්ඵලකං ඨපෙත්වා සි යොදනු. (මහාකත්තරිං – මහ කතුර; මහාසණ්ඩාසං – මහ අඬුව;) මහාපිප්ඵලකං – මහකඩ කතුර; සබ්බං – මෙ තුණින් පිටත් සියල්ල; වට්ටති – බෙදන්නට වටි. ඉතරානි – ඒ භාජනීයව ඉතර වූ මහාකත්තරි ආදි වූ එ තුණ ගරුභණ්ඩයෝ යි. ”

කඞ්ඛාවිතරණී පිටපොත.

පස්වන රාශියට අයත් වල්ලි, වේළු, මුඤ්ජ, බබ්බජ, තිණ, දාරුභණ්ඩ, මත්තිකාභණ්ඩ යන මොවුන්ගේ විනිශ්චය මෙතැන් පටන් දත යුත්තේ ය.

18. වල්ලි.

“ වල්ලිආදිසු වෙත්තවල්ලිආදිකා යා කාචි අඩ්ඪබාහුප්පමාණා වල්ලි සඞ්ඝස්ස දින්නා වා තත්ථ ජාතකා වා රක්ඛිතගොපිතා ගරුභණ්ඩා. සා සඞ්ඝකම්මෙ ච චෙතියකම්මෙ ච කතෙ සචෙ අතිරෙකා හොති පුග්ගලිකකම්මෙපි උපනෙතුං වට්ටති. අරක්ඛිතා පන ගරුභණ්ඩමෙව න හොති. සුත්තමකචිවාකනාළිකෙරහීර චම්මමයා රජ්ජුකා වා යොත්තානි වා වාකෙ ච නාළිකෙරහීරෙ ච වට්ටෙත්වා කතා එකවට්ටා වා සඞ්ඝසන්තකා ගරුභණ්ඩා. සුත්තං පන අවට්ටෙත්වා දින්නමකචිවාකනාළිකෙරහීරා ච භාජනීයාව. යෙහි පනෙතානි රජ්ජුකාදීනි දින්නානි හොන්ති තෙ අත්තනො කරණීයෙන හරන්තා න වාරෙතබ්බා. ”

සමන්තපාසාදිකා - කඞ්ඛාවිතරණී.

“ අඩ්ඪබාහූති කප්පරතො පට්ඨාය යාව අංසකූටාති ගණ්ඨිපදෙසු වුත්තං. අඩ්ඪබාහු නාම විදත්ථිචතුරඞ්ගුලන්ති වදන්ති. තත්ථ ජාතකාති සඞ්ඝිකභූමියං ජාතා. ”

සාරත්ථදීපනී - පාලිමුත්තක විනයවිනිච්ඡය ටීකා.

“ අඩ්ඪබාහුප්පමාණා නාම හත්ථමත්තා අඩ්ඪහත්ථඅඩ්ඪබ්‍යාම මත්තාති වදන්ති. යොත්තානීති චම්මරජ්ජුකා. ”

විමතිවිනොදනී.

“ අඩ්ඪබාහුප්පමාණාති කප්පරතො පට්ඨාය යාව අංසකූටප්පමාණා විදත්ථිචතුරඞ්ගුලප්පමාණාති වුත්තං හොති. තත්ථ ජාතකාති සඞ්ඝිකභූමියං ජාතා. ආරක්ඛසංවිධානෙන රක්ඛිතත්තා රක්ඛිතා ච සා මඤ්ජූසාදිසු පක්ඛිත්තං විය යථා තං න නස්සති එවං ගොපනතො ගොපිතා චාති රක්ඛිතගොපිතා. තත්ථ ජාතකාපි පන අරක්ඛිතා ගරුභණ්ඩමෙව න හොති. සඞ්ඝකම්මෙ ච චෙතිය

කම්මෙ ච කතෙති ඉමිනා සඞ්ඝසන්තකෙන චෙතියසන්තකා රක්ඛිතුං පරිවත්තිතුං ච වට්ටතීති දීපෙති. සුත්තම්පනාති වට්ටිතඤ්චෙව අවට්ටිතඤ්ච සුත්තං.”

විනයත්ථමඤ්ජූසා.

“(වල්ලිආදිසු – වල්ලි, වෙළු ආදීන් පිළිබඳ විනිශ්චයෙහි;) **වෙත්තවල්ලිආදිකා** – වේවැල් ආදි වූ; “අඩ්ඪබාහුප්පමාණා යා කාචි වල්ලී” යි යොදනු. අඩ්ඪබාහු නම් උරෙහි සිට වැලමිට දක්වා මෙ දෙ අතුරෙහි යි. අඩ්ඪබාහූති කප්පරතො පට්ඨාය යාව අංසකූටං. නොහොත් විදත්ථිචතුරඞ්ගුල හෝ යි. (උරෙහි සිට වැලමිට දක්වා මෙ දෙඅතුර පමණ වූ නොහොත් එක්වියත් සතරඟුල් පමණ වූ වේවැල් ආදි යම් කිසි වැලක් සඞ්ඝයාට දෙනලද්දී ගරුභණ්ඩ වේ.) **තත්ථ ජාතකා වා** – ඒ සාඞ්ඝිකවිහාරයෙහි හට ගත්තා වූ; **රක්ඛිතගොපිතා** – රක්ඛිත ගොපිත යන බස අර්ථ: “ආරක්ඛසංවිධානෙන රක්ඛිතත්තා රක්ඛිතා ච මඤ්ජූසාදිසු පක්ඛිත්තං විය ගොපිතත්තා ගොපිතා ච” යනු වාක්‍යය හඟවනු පිණිස කීහු. (ආරක්ෂාසංවිධානයෙන් යුක්ත ව රක්නාලද හෙයින් රක්ඛිත නමුදු වේ. කරඬු ආදියෙහි බහා තබන ලද්දක් මෙන් ගොපනය කරණලද හෙයින් ගොපිත නමුදු වේ ය යි රක්ඛිතගොපිත ය යි කියනලදී.) සාඞ්ඝිකභූමියෙහි ජාත වුව ද රක්ඛිත ගොපිත නො වේ නම් ගරුභණ්ඩ නො වෙයි යන අභිප්‍රාය යි. **සා වල්ලි** – ඒ වල්ලි තොමෝ; (සඞ්ඝයා පිළිබඳ කටයුතු ද චෛත්‍ය පිළිබඳ කට යුතු ද කොට නිමි කල්හි ඉදින් තව ඉතිරි වේ නම් පෞද්ගලික කටයුත්තෙහි ද;) **උපනෙතුං** – එළවන්නට; **වට්ටති** – වටී. (සඞ්ඝසන්තක දෙයින් චෛත්‍යසන්තක දෙය රක්නට ද මාරු කරන්නට ද යොග්‍ය බව මෙයින් දක්වනලදී.) **සුත්ත** – හූ; **මකචි** – නියඳ; **වාක** – වැහැරි; **නාළිකෙරහීර** – පොල්කොසුමය වූ හෝ; **චම්මමයා රජ්ජුකා වා** – සම්මය වූ රැණ හෝ; **යොත්තානි වා** – කඹ හෝ; **සඞ්ඝස්ස සන්තකං ගරුභණ්ඩං** යි යොදනු. **වාකෙ ච නාළිකෙරහීරෙ ච** – නියඳ ආදි වැහැරි ද පොල්කොසු ද; **වට්ටෙත්වා** – වටා, කරකවා; **කතා** – කරණලද; **එකවට්ටා වා** – එක් වැල වූ රජ්ජු තොමෝ; **සඞ්ඝස්ස සන්තකා** – සඟසතු වූවා; **ගරුභණ්ඩා** – ගරුභණ්ඩ යි. **සුත්තං පන** – හූ ද; හූ ලනු කොට නො දී නිකම් කරකැවුව ද භාජනීය හෙයින් සූත්‍රයට ‘අවට්ටෙත්වා’ යනු නො කීහු. **අනාවට්ටෙත්වා දින්න මකචි** – නො අඹරා දුන්නා වූ නියඳ ද; **නාළිකෙරහීරා ච** – නාලිකෙර හීරයෝ ද; භාජනීයයෝ යි.”

කඞ්ඛාවිතරණී පිටපොත.

19. වෙළු.

“යො කොචි අන්තමසො අට්ඨඞ්ගුලසූචිදණ්ඩමත්තොපි වෙළු සඞ්ඝස්ස දින්නො වා තත්ථ ජාතකො වා රක්ඛිතගොපිතො ගරුභණ්ඩං. සොපි සඞ්ඝකම්මෙ ච චෙතියකම්මෙ ච කතෙ අතිරෙකො පුග්ගලිකකම්මෙ කාතුං වට්ටති. පාදගණ්හනකතෙලනාළි පන, කත්තරයට්ඨි, උපාහනදණ්ඩකො, ඡත්තදණ්ඩො, ඡත්තසලාකාති ඉදමෙත්ථ භාජනීයභණ්ඩං. දඩ්ඪගෙහමනුස්සා ගණ්හිත්වා ගච්ඡන්තා න වාරෙතබ්බා. රක්ඛිතගොපිතං වෙළුං ගණ්හන්තෙන සමකං වා අතිරෙකං වා ථාවරං අන්තමසො තංඅග්ඝනකම්පි ඵාතිකම්මං කත්වා ගහෙතබ්බො. ඵාතිකම්මං අකත්වා ගණ්හන්තෙන තත්ථෙව වළඤ්ජෙතබ්බො. ගමනකාලෙ සඞ්ඝිකාවාසෙ ඨපෙත්වා ගන්තබ්බං. අසතියා ගහෙත්වා ගතෙන පහිණිත්වා දාතබ්බො. දෙසන්තරං ගතෙන සම්පත්තවිහාරෙ සඞ්ඝිකාවාසෙ ඨපෙතබ්බො.”

සමන්තපාසාදිකා.

“අට්ඨඞ්ගුලසූචිදණ්ඩමත්තොති අන්තමසො දීඝසො අට්ඨඞ්ගුලමත්තො, පරිණාහතො සීහළපණ්ණසූචිදණ්ඩමත්තො. එත්ථාති වෙළුභණ්ඩෙ. දඩ්ඪං ගෙහං යෙසං තෙ = දඩ්ඪගෙහා. න වාරෙතබ්බාති මා ගණ්හිත්වා ගච්ඡථාති න නිසෙධෙතබ්බා. දෙසන්තරගතෙන සම්පත්තවිහාරෙ සඞ්ඝිකාවාසෙ ඨපෙතබ්බො.

විනයත්ථමඤ්ජූසා.

“සූචිදණ්ඩමත්තොපීති සරදණ්ඩාදිසූචිආකාරතනුදණ්ඩකමත්තොපි.”

විමතිවිනොදනී.

“**අට්ඨඞ්ගුලසූචිදණ්ඩකමත්තො** – උසින් අටඟුලක් පමණ ඇති වටින් හෙලදිවැ පන්හිත්දඬක් පමණ ඇත්තා වූ, යො කොචි වෙළු යි යොදනු. **තත්ථ ජාතකො** – ඒ සාඞ්ඝික භූමියෙහි උපන්නා වූ; (**සොපි වෙළු** – ඒ හුණදණ්ඩ ද; සඞ්ඝයා පිළිබඳ කට යුතු ද –පෙ– වටී.) **පාදගණ්හනක** – මගධනැළියෙන් දිය පස්නැළියක් ගන්නා වූ; **තෙලනාළි පන** – හුණුදඬෙ තෙල්නල ද; මෙහි මගධනැළි නම් අටපත් ගන්නා නැළිය යි. (**කත්තරයට්ඨි** – සැරයටිය ද;) **උපාහනදණ්ඩකො** – වාන් (= වහන්) කොක්ක ද; **ඡත්තදණ්ඩො** – කුඩපුඬුව ද; **ඡත්තසලාකා** – කුඩයෙහි ගොනැස් (= කුඩනත) ද යන මෙ සියල්ල; **එත්ථ** – මේ වෙළුමයෙහි ලා බෙදිය යුතු භාණ්ඩ යි. (දා ගිය ගෙය ඇති මිනිස්සු ගෙණ යන්නාහු නො මැළැක්විය යුත්තාහ.)

20. මුඤ්ජ.

මුඤ්ජං – මූදුතණ;

21. බබ්බජ.

බබ්බජං – බබුස්තණ;

22. තිණ.

“තිණන්ති මුඤ්ජං බබ්බජං ච ඨපෙත්වා අවසෙසං යං කිඤ්චි තිණං. යත්ථ පන තිණං නත්ථි තත්ථ පණ්ණෙහි ඡාදෙන්ති. තස්මා පණ්ණම්පි තිණෙනෙව සඞ්ගහිතං. ඉති මුඤ්ජාදිසු යං කිඤ්චි මුට්ඨිප්පමාණම්පි තිණං තාලපණ්ණාදිසු ච එකං පණ්ණම්පි සඞ්ඝස්ස දින්නං වා තත්ථ ජාතකං වා බහාරාමෙ සඞ්ඝස්ස තිණවත්ථුම්හි ජාතතිණං වා රක්ඛිතගොපිතං ගරුභණ්ඩං හොති. තම්පි සඞ්ඝකම්මෙ ච චෙතියකම්මෙ ච කතෙ අතිරෙකං පුග්ගලිකකම්මෙ දාතුං වට්ටති. දඩ්ඪගෙහමනුස්සා ගහෙත්වා ගච්ඡන්තා න වාරෙතබ්බා. අට්ඨඞ්ගුලප්පමාණොපි රිත්තපොත්ථකො ගරුභණ්ඩමෙව.”

සමන්තපාසාදිකා.

“අවසෙසං ඡදනතිණන්ති මුඤ්ජබබ්බජෙහි අවසෙසං යං කිඤ්චි ඡදනතිණං. යත්ථ පන තිණං නත්ථි තත්ථ පණ්ණෙහි ඡාදෙන්ති, තස්මා පණ්ණම්පි තිණෙනෙව සඞ්ගහිතන්ති ආහ: “ඡදනතිණසඞ්ඛෙපගතෙසු”ති ආදි. අට්ඨඞ්ගුලප්පමාණොපීති විත්ථාරතො අට්ඨඞ්ගුලප්පමාණො. ලිඛිතපොත්ථකො පන ගරුභණ්ඩං න හොති.”

විනයත්ථමඤ්ජූසා.

“මුඤ්ජබබ්බජනං පාලියංයෙව විසුං ආගතත්තා මුඤ්ජඤ්ච බබ්බජඤ්ච ඨපෙත්වාති වුත්තං. අට්ඨඞ්ගුලප්පමාණොති දීඝතො අට්ඨඞ්ගුලප්පමාණො.”

සාරත්ථදීපනී - පාලිමුත්තකවිනයවිනිච්ඡයටීකා.

“රිත්තපොත්ථකොති අලිඛිතපොත්ථකො. ඉදඤ්ච පණ්ණප්පසඞ්ගෙන වුත්තං.”

විමතිවිනොදනී.

“අට්ඨඞ්ගුලප්පමාණොති දීඝතො අට්ඨඞ්ගුලප්පමාණො. රිත්තපොත්ථකොපීති අලිඛිතපොත්ථකොපි. ඉදඤ්ච පණ්ණප්පසඞ්ගෙන වුත්තං.”

විනයාලඞ්කාර.

“**මුඤ්ජඤ්ච** – මුදුතණ ද; **බබ්බජඤ්ච** – බබුස්තණ ද; (ඨපෙත්වා – හැර; මුදුතණ හා බබුස්තණ ගරුබඩු වශයෙන් පාලියෙහි ම වෙන් ව කියනලද හෙයින් ඒ දෙක හැර සෙසු තණ මෙහි තිණ ශබ්දයෙන් ගන්නාලදී.) **මුට්ඨිප්පමාණම්පි** – මිටක් පමණ ඇත්තා ද වූ; මුට්ඨි නම් තණකැරැල්ල යි. **අවසෙසඤ්ච ඡදනතිණං** – මෙ දෙකින් අවශෙෂ වූ ගෙ සොයන තණ ද; **තිණසඞ්ඛෙපගතෙසු** – තෘණසඞ්ඛ්‍යාවට ගියා වූ; **තාලපණ්ණාදිසු** – තල්පත් ආදීන් අතුරෙහි; **යං කිඤ්චි** – යම් කිසි; **එකපණ්ණම්පි** – එක පතකු දු; **බහිආරාමෙ** – ආරාමයෙන් පිටත; **සඞ්ඝිකෙ** – සාඞ්ඝික වූ; **තිණවත්ථුස්මිං** – තෘණභූමියෙහි, තණවත්තෙහි; **තම්පි** – ඒ තෘණ ද;

අට්ඨඞ්ගුලප්පමාණොපි - මුවවිට අටඟුලක් පමණ ඇත්තා වූ; **රිත්තපොත්ථකො** - පුස්පත් ගෙඩිය ද; මෙයින් පුස්පත් භාජනීය බව කීහු. (ලියූ පොත වනාහි ගරුභණ්ඩ නො වේ.)"

කඞ්ඛාවිතරණී පිටපොත.

" අට්ඨඞ්ගුලප්පමාණොපීති දීඝතො අට්ඨඞ්ගුලමත්තකොපි. පුථුලතොතිපි වදන්ති. රිත්තපොත්ථකොති ලෙඛාහි සුඤ්ඤපොත්ථකො. නලිඛිතපොත්ථකොති වුත්තං හොති. අට්ඨඞ්ගුලප්පමාණොති ඉමිනා අට්ඨඞ්ගුලතො ඌනප්පමාණො භාජියො. රිත්තපොත්ථකොති ඉමිනා අට්ඨඞ්ගුලතො අතිරෙකප්පමාණොපි ලිඛිතපොත්ථකොපි භාජියොති දස්සෙති. "

විමතිවිනොදනී ටීකා.

අටඟුල් පමණ නම් දිගින් අටඟුල් පමණ යි. පුළුලිනැයි ද කියත්. රිත්තපොත්ථක නම් නො ලියූ පොත් ගෙඩිය යි. අටඟුලට වඩා අඩු පමණ වූ පොත ගරු බඩු නො වෙ යි. බෙදිය යුතු. හිස් පොත්ගෙඩිය ගරුබඩු ය යි දක්වීමෙන් අටඟුලින් වැඩි පමණ වූ ද ලියනලද පොත බෙදිය යුතු ය යි කී නියා යි.

23. මත්තිකා.

" මත්තිකා පකතිමත්තිකා වා හොතු පඤ්චවණ්ණා වා සුධා වා සජ්ජුරසකඞ්කුට්ඨසිලෙසාදිසු වා යං කිඤ්චි දුල්ලභට්ඨානෙ ආනෙත්වා වා දින්නං තත්ථ ජාතකං වා රක්ඛිතගොපිතං තාලපක්කමත්තං ගරුභණ්ඩං හොති. තම්පි සඞ්ඝකම්මෙ ච චෙතියකම්මෙ ච කතෙ අතිරෙකං පුග්ගලිකකම්මෙ දාතුං වට්ටති. හිඞ්ගුහිඞ්ගුලහරිතාලමනොසිලාඅඤ්ජනානි පන භාජනීයානි. "

සමන්තපාසාදිකා - කඞ්ඛාවිතරණී.

" **මත්තිකා** - මත්තිකා තොමෝ; **පකතිමත්තිකා වා** - පියෙවි මැටි වෙව යි; **පඤ්චවණ්ණා වා** - මකුල් ගුරු ආදි වූ පඤ්චවණී මැටි වෙව යි; **සුධා වා** - සුණු වෙව යි; **සජ්ජුරස** - සදෙල මල ද; **කඞ්කුට්ඨ** - කොකැටිකිරි ද; **සිලෙසාදිසු වා** - ශිවුළු පැණි ආදි වූ ලභටු ද; **දුල්ලභට්ඨානෙ** - අරමට; **ආනෙත්වා** - උපාසකවරුන් විසින් ගෙණ ඇර; **දින්නං වා** - දෙන ලද්දේ හෝ; **තාලපක්කප්පමාණං** - තල්පකක් (= තල්ගෙඩියක්) පමණ වූයේ (ගරුභණ්ඩ වේ.) (හිඞ්ගුහිඞ්ගුලහරිතාලමනොසිලාඅඤ්ජනයෝ බෙදිය යුත්තාහු ය.) **හිඞ්ගු** - සුහි (පෙරුංකායම්); **හිඞ්ගුල** - හිඟුලි. **හරිතාල** - සිරියෙලි; **මනොසිලා** - රත්සිරියෙලි; **අඤ්ජනානි** - අඤ්ජනයෝ ද; අඳුන්දූලි යි. හිඟුල් ආදිය මත්තිකාවට අනුලොම්. "

කඞ්ඛාවිතරණී පිටපොත

“ අඤ්ජනං හරිතාලඤ්ච තථා හිඞ්ගු මනොසිලා,
භාජෙතබ්බානි විඤ්ඤෙය්‍යං විඤ්ඤුනා විනයඤ්ඤුනා. ”
විනයවිනිච්ඡය.

“ වල්ලිඩ්ඪබාහුමත්තාපි – වෙළු අට්ඨඞ්ගුලායතා,
තිණාදි මුට්ඨිමත්තම්පි – පණ්ණමෙකම්පි මත්තිකා.
පාකතා පඤ්චවණ්ණා වා – සුධා කඞ්කුට්ඨආදිකා,
තාලපක්කප්පමාණාපි – දින්නා වා තත්‍ථ ජාතකා.
රක්ඛිතා සඞ්ඝිකා රජ්ජු – යොත්තාදී ච අභාජියා,
නිට්ඨිතෙ භාජියා කම්මෙ – සඞ්ඝිකෙ චෙතියස්ස වා.
පත්තාදි භික්ඛුසාරුප්පං – තථා විප්පකතාකතං,
භාජියං ලොහභණ්ඩෙසු – වාරකං පාදගණ්හකං. ”
ඛුද්දසික්ඛා.

“ ආදිතො තයො රාසී ඨපෙත්වා චතුත්ථරාසිතො පට්ඨාය ගරුභණ්ඩාගරුභණ්ඩෙ විභජිතුං වල්ලීති ආදි ආරද්ධං. අඩ්ඪබාහුමත්තාපි වල්ලී ච, අට්ඨඞ්ගුලායතා වෙළු ච, මුට්ඨිමත්තම්පි තිණාදි ච, එකම්පි පණ්ණඤ්ච, පාකතා වා පඤ්චවණ්ණා වා තාලපක්කප්පමාණාපි මත්තිකා ච, තාලපක්කප්පමාණාපි සුධා ච, තාලපක්කප්පමාණාපි කඞ්කුට්ඨආදිකා ච දින්නා වා තත්‍ථ ජාතකා වා සඞ්ඝිකා රක්ඛිතා අභාජියා. රජ්ජුයොත්තාදී ච දින්නා සඞ්ඝිකා අභාජියාති යොජනා.

වෙළු පරිණාහතො පණ්ණසූචිදණ්ඩමත්තොපි ගහෙතබ්බො. තිණං මුඤ්ජං බබ්බජඤ්ච ආදිසද්දසඞ්ගහිතං ඨපෙත්වා අවසෙසං යං කිඤ්චි තිණං. පණ්ණො අට්ඨඞ්ගුලප්පමාණො රිත්තපොත්ථකො ගරුභණ්ඩමෙව පාකතාති පකතියා ජාතා. පඤ්චවණ්ණාති රත්තසෙතාදිපඤ්චවණ්ණා. සුධාකඞ්කුට්ඨආදයො මත්තිකාගහණෙන ගහිතා. කඞ්කුට්ඨආදිකාති ආදිසද්දෙන සජ්ජුරසජාතිහිඞ්ගුලකාදීනං ගහණං. දින්නාති සඞ්ඝස්ස දින්නා. තත්‍ථ ජාතකාති සඞ්ඝිකභූමියං ජාතා. රජ්ජුයොත්තාදීති සුත්තමකචිවාකනාළිකෙරහීරචම්මමයා රජ්ජු ච යොත්තාදි ච. ආදිසද්දෙන මකචිවාකාදිකෙ වට්ටෙත්වා කතා එකවට්ටා ගහිතා. බ්‍යතිරෙකවසෙන පනෙත්‍ථ චතුත්ථරාසිම්හි ඉතරෙ භාජියාති වෙදිතබ්බා. සඞ්ඝිකෙ කම්මෙ චෙතියස්ස වා කම්මෙ නිට්ඨිතෙ භාජියාති යොජනීයං.

ලොහභණ්ඩෙසු භික්ඛුසාරුප්පං පත්තාදි වා තථා විප්පකතාකතං ලොහභණ්ඩං, තථා පාදගණ්හකං වාරකං භාජියන්ති යොජනා. පත්තාදීති අයො පත්තො අයථාලකං තම්බලොහථාලකං අඤ්ජනී අඤ්ජනිසලාකා කණ්ණමලහරණී සූචි පණ්ණසූචි ඛුද්දකො පිප්ඵලකො ඛුද්දකං ආරකණ්ටකං කුඤ්චිකා තාලකාදි. විප්පකතන්ති අපරිනිට්ඨිතං. අකතන්ති සබ්බසො අකතං, පාදගණ්හ

කන්ති සීහලදීපෙ පාදගණ්හනකං. පාදො නාම චතුත්ථංසො. මගධනාළියා පඤ්චනාළිමත්තො. මගධනාළි ච නාමෙසා ඌනපඤ්චපසතා වෙදිතබ්බා. තථා සට්ඨිකො තෙලභාජනඤ්ච. ”

ඛුද්දසික්ඛා ටීකා.

“ අඩ්ඪබාහුමත්තාපි – අඩබාහුවක් පමණ ද වූ; වල්ලි – වැල් ද; අට්ඨඞ්ගුලායතා – අටඟුලක් දිග ඇති; වෙළු – (පන්හීත් දඬක් පමණ ද වූ) හුණ ද; මුට්ඨිමත්තම්පි – මිටක් පමණ ද වූ; තිණාදි – (ගේ සොයන) තණ හා ආදි ශබ්දයෙන් ගත් මුදුතණ බබුස්තණ ද; එකම්පි – එක ද; පණ්ණං – (තල් පත් ඈ) පතෙක් ද; තාලපක්කප්පමාණා අපි – තල්පකක් පමණ ද වූ; පාකතා – පියෙවි හෝ; පඤ්චවණ්ණා වා (නිල් ඈ) පස්වණක් පෑ ඇති හෝ; මත්තිකා – මැටි ද; සුධා – සුණු ද; කුඞ්කුට්ඨාදිකා – කොකටු සදෙලමල ඈ ද යන මොහු; දින්නා වා – (සඟහට) දෙන ලද්දාහු හෝ; තත්ථ ජාතකා – සඞ්ඝිකභූමියෙහි උපන්නාහු හෝ; රක්ඛිතා – රක්නා ලද්දාහු ම; අභාජියා – නො බෙදිය යුත්තාහු සි. සඞ්ඝිකා – සඟසතු වූ; රජ්ජු – (හූ නියඳ කොස්සෙන් කළ) රැහැණ ද; යොත්තාදී ච – (සමින් කළ) යොත් ආදීහු ද; අභාජියා – නො බෙදිය යුත්තාහු සි. සඞ්ඝිකෙ කම්මෙ – සඟසතු කටයුතු ද; චෙතියස්ස වා – චෛත්‍ය සන්තක කටයුතු ද; නිට්ඨිතෙ – නිමි කල්හි; භාජියා – බෙදිය යුත්තාහු සි.

ලොහභණ්ඩෙසු – ලොහභණ්ඩයෙහි; භික්ඛුසාරුප්පං – මහණුන්ට සරුප් වූ; පත්තාදි – පාත්‍ර (තලු) ආදිය ද; තථා – එසේ මැ; විප්පකත – කොට නො නිමි ලොහො බඩු ද; අකතං – යපලු ඈ නො කළ ලොහො බඩු ද; පාදගණ්හනකං – මගධනැළියෙන් පස් නැළියක් තෙල් ගන්නා; වාරකං – කළය ද; භාජියං – බෙදිය යුත්තේ සි.”

ඛුද්දසික්ඛාසන්න.

24. දරුභණ්ඩ.

“ දරුභණ්ඩෙ යො කොචි අට්ඨඞ්ගුලසූචිදණ්ඩමත්තොපි දරුභණ්ඩකො දරුදුල්ලභට්ඨානෙ සඞ්ඝස්ස දින්නො වා තත්ථ ජාතකො වා රක්ඛිතගොපිතො අයං ගරුභණ්ඩං හොතීති කුරුන්දියං වුත්තං. මහාඅට්ඨකථායම්පන සබ්බම්පි දරුවෙළුචම්මපාසාණාදිවිකතිං දරුභණ්ඩෙන සඞ්ගණ්හිත්වා “ තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස ආසන්දිකො උප්පන්නො හොතී ” ති ඉතො පට්ඨාය දරුභණ්ඩවිනිච්ඡයො වුත්තො. තත්‍රායං අත්ථුද්ධාරො: ආසන්දිකො සත්තඞ්ගො භද්දපීඨං පීඨිකා එළකපාදපීඨං ආමලකවට්ටිකපීඨං ඵලකං කොච්ඡං පලාලපීඨකන්ති ඉමෙසු තාව යං කිඤ්චි ඛුද්දකං වා හොතු මහන්තං වා සඞ්ඝස්ස දින්නං ගරුභණ්ඩං හොති. පලාලපීඨෙන

චෙත්ථ කදලිපත්තාදිපීඨානිපි සඞ්ගහිතානි. ව්‍යග්ඝචම්මඔනද්ධම්පි වාළරූපපරික්ඛිත්තං රතනපරිසිබ්බිතං කොච්ඡං ගරුභණ්ඩමෙව. වඞ්කඵලකං, දීඝඵලකං, චීවරධොවනඵලකං, ඝට්ටනඵලකං, ඝට්ටනමුග්ගරො, දන්තකට්ඨච්ඡෙදනගණ්ඨිකා, දණ්ඩමුග්ගරො, නාවා, අම්මණං, රජනදොණි, උදකපටිච්ඡකො දාරුමයො වා දන්තමයො වා වෙළුමයො වා, සපාදකොපි අපාදකොපි සමුග්ගො, මඤ්ජූසා, පාදගණ්හනකතො අතිරෙකප්පමාණො කරණ්ඩො, උදකදොණි, උදකකටාහං, උළුඞ්කො, කටච්ඡු, පානීයසරාවං, පානීයසඞ්ඛොති එතෙසුපි යං කිඤ්චි සඞ්ඝස්ස දින්නං ගරුභණ්ඩං."

සමන්තපාසාදිකා.

"වෙළුම්හි වුත්තප්පමාණොති අට්ඨඞ්ගුලසූචිදණ්ඩමත්තොපීති වෙළුභණ්ඩෙ වුත්තප්පමාණො. සඞ්ඝස්ස දින්නො වාති දාරුදුල්ලභට්ඨානෙ සඞ්ඝස්ස දින්නො වා. කුරුන්දියං වුත්තත්තමෙව දාරුභණ්ඩවිනිච්ඡයං වත්වා ඉදානි මහාඅට්ඨකථායං වුත්තත්තමෙව වත්තුං 'අපි චා'ති ආදිමාහ. ආසන්දිකානීති එත්ථ ආසන්දිකොති චතුරස්සපීඨං වුච්චති. උච්චකම්පි ආසන්දිකන්ති වචනතො එකතොභාගෙන දීඝපීඨමෙව හි අට්ඨඞ්ගුලපාදකං න වට්ටති. චතුරස්සාසන්දිකො පමාණාතික්කන්තොපි වට්ටතීති වෙදිතබ්බො. ආදිසද්දෙන සත්තඞ්ගො භද්දපීඨං පීඨිකා එළකපාදකපීඨං ආමලකවට්ටිකපීඨං ඵලකං කොච්ඡං පලාලපීඨන්ති ඉමෙ සඞ්ගණ්හන්තීති වෙදිතබ්බා. තෙනාහ: 'අන්තමසො'ති ආදි. පණ්ණෙහි වාති කදලිපණ්ණාදීහි වා. බ්‍යග්ඝචම්මඔනද්ධම්පි වාළරූපපරික්ඛිත්තං රතනපරිසිබ්බිතං කොච්ඡං ගරුභණ්ඩමෙව. ඝට්ටනඵලකන්නාම යත්ථ ඨපෙත්වා රජිතචීවරං හත්ථෙන ඝට්ටෙන්ති. ඝට්ටනමුග්ගරො නාම අනුවාතාදිඝට්ටනකොති වදන්ති. දණ්ඩමුග්ගරො නාම යෙන රජිතචීවරං පොථෙන්ති. අම්මණන්ති ඵලකෙහි පොක්ඛරණී විය කතං පානීයභාජනං. රජනදොණීති පක්කරජනං ආකිරිත්වා ඨපනභාජනං."

විනයත්ථමඤ්ජූසා.

"ඝට්ටනඵලකං ඝට්ටනමුග්ගරොති ඉදං රජිතං චීවරං එකස්මිං මට්ඨෙ දණ්ඩමුග්ගරෙ වෙඨෙත්වා එකස්ස මට්ඨඵලකස්ස උපරි ඨපෙත්වා උපරි අපරෙන මට්ඨඵලකෙන නික්කුජ්ජිත්වා එකො උපරි අක්කමිත්වා තිට්ඨති. ද්වෙ ජනා උපරිඵලකං ද්වීසු කොටිසු ගහෙත්වා අපරාපරං ආකඩ්ඪනවිකඩ්ඪනං කරෙන්ති, එතං සන්ධාය වුත්තං. හත්ථෙ ඨපාපෙත්වා හත්ථෙන පහරණම්පන නිට්ඨිතරජනස්ස චීවරස්ස අල්ලකාලෙ කාතබ්බං. ඉදං පන ඵලකමුග්ගරෙහි ඝට්ටනං සුක්ඛකාලෙ ථද්ධභාවවිමොචනත්ථන්ති දට්ඨබ්බං. අම්ම

ණන්ති එකදොණිනාවා ඵලකෙහි පොක්ඛරණීසදිසං කතං. පානීය භාජනන්තිපි වදන්ති. රජනදොණීති එකදරුනා කතං රජන භාජනං. උදකදොණිපි එකදරුනාව කතං උදකභාජනං.”

විමතිවිනොදනී.

“ආසන්දිකොති චතුරස්සපීඨං වුච්චති. අයං පන පමාණාතික්කන්තොපි වට්ටති. ‘අනුජානාමි භික්ඛවෙ උච්චකම්පි ආසන්දික’න්ති වචනතො එකතො භාගෙන දීඝපීඨමෙව. බහිඋච්චපාදකං න වට්ටති. සත්තඞ්ගො නාම තීසු දිසාසු අපස්සයං දත්වා කතමඤ්චො. අයම්පි පමාණාතික්කන්තො වට්ටති. භද්දපීඨන්ති වෙත්තමයං පීඨං වුච්චති. පීඨිකාති පිලොතිකාබද්ධපීඨමෙව. එළකපාදපීඨං නාම දරුවට්ටිකාය උපරි පාදෙ ඨපෙත්වා භොජනඵලකං විය කතපීඨං. ආමලකවට්ටිකපීඨං නාම ආමලකාකාරෙන යොජිතං බහුපාදකපීඨං. කොච්ඡන්ති උසීරමයං වා මුඤ්ජබබ්බජමයං වා. ඝට්ටනඵලකං නාම යත්ථ ඨපෙත්වා රජිතචීවරං හත්ථෙන ඝට්ටෙන්ති. ඝට්ටනමුග්ගරො නාම අනුවාතාදිඝට්ටනත්ථං කතොති වදන්ති. අම්බණන්ති ඵලකෙහි පොක්ඛරණීසදිසං කතං පානීයභාජනං. රජනදොණීති යත්ථ පක්කරජනං ආකිරිත්වා ඨපෙන්ති.”

පාලිමුත්තකවිනයවිනිච්ඡයටීකා.

“වෙළුම්හි වුත්තප්පකාරෙ යො කොචි දරුභණ්ඩකො” යි යොදනු. අපි ච – තව ද අනිකෙක් ඇති. ‘දරුවෙළුචම්මපාසාණාදි සබ්බාපි විකති දරුභණ්ඩෙන සඞ්ගහිතා’ යි යොදනු. තත්ථ – ඒ මිශ්‍රයෙහි අනී කියම්හ යි සේ යි. මඤ්චපීඨෙහි – මඤ්චපීඨයන් හා; අසඞ්ගහිතානි – අසඞ්ගෘහිත වූ; ආසන්දිකාදීනි – ආසන්දිකා දීහු ද; ආදි ශබ්දයෙන් සත්තඞ්ග භද්දපීඨ පීඨිකා එළකපාදපීඨ ආමලකවට්ටිකපීඨාදි ගත්හු. අන්තමසො – අධමාන්තයෙන්; පලාලෙන – පිදුරෙන් හෝ; පණ්ණෙහි වා – තාලපණ්ණාදි පතින් හෝ; කතපීඨං උපාදාය – කරණලද පුටුයෙහි පටන් කොට; සබ්බානි ආසනානි – සියලු ආසනයෝ ද; වඞ්කඵලකං – වක් පොහොරුව ද; දීඝඵලකං – දික් පොහොරුව ද; චීවරධොවනඵලකං – සිවුරු සෝධන පොහොරුව ද; ඝට්ටනඵලකං – සිවුරු ඝට්ටන පොහොරුව ද; ඝට්ටනමුග්ගරො – සිවුරු ඝට්ටන මුගුර ද; දන්තකට්ඨච්ඡෙදනගණ්ඨිකා – දැහැටි දඬු කපන කොලොඹුව ද; දණ්ඩමුග්ගරො – සතරරියනක් පමණ ඇති මුගුර ද නොහොත් අතකොලුව ද; ‘දණ්ඩමුග්ගරො නාම යෙන රජිතචීවරං පොථෙන්ති’ යනු වජ්‍රබුද්ධිටීකා යි. නාවා – නැව ද; අම්බණං – පරිෂ්කාර තබන දෙණ ද; රජනදොණි – රදන් දෙණ ද; රදන් දෙණ නම් පිසූ (= උණු කළ) පඬු වත් කරණ දෙණ යි. උදකපටිච්ඡි

කො – දියපැස ද; දාරුමයො වා – දඬුමය වූ හෝ; දන්තමයො වා – හස්තිදන්තාදි දළමය වූ හෝ; වෙළුමයො වා – හුණුපොත් තෙන් කරණලද හෝ; සපාදකොපි – පා ඇත්තා ද වූ; අපාද කොපි – පා නැත්තා ද වූ; සමුග්ගා – බෙහෙත් සත් පොඩි දී චතුරශ්‍ර කොට කරණලද සුමුග ද; මඤ්ජුසා – දඬෙන් දළින් හෝ හුණදඬෙන් හෝ කෘත චෘතත්‍රාකාර මඤ්ජුසා ද දෙණ පෙට්ටි ද කියත්. පාදගණ්ඨනකනො – දිය පස්නැලියක් ගන්නෙත්; අති රෙකපපමාණො – අධිකප්‍රමාණ වූ; කරණ්ඩා – කාෂ්ඨමය වූ කරඬුව ද; උදකදෙ‍ාණි – දිය දෙණ; උදකකටාහං – දිය ඉකිලි ව්ලි; උලුඞකා – ලු; කටච්ඡු – සැන්ද ද; පානීයසරාවං – පැන් වසන මලාව ද; පානීයසඞ්ඛා – පැන්සක ද; (යන මොවුන් අතුරෙන් යම් කිසිවක් සඞ්ඝයාට දෙන ලද්දේ ගරුභණ්ඩ යි.)"

කඞ්ඛාවිතරණී පිටපොත.

"ආසන්දිකොති චතුරස්සරපීඨං. සත්තඞ්ගනාති තීසු දිසාසු අප ස්සයෙ යොජෙත්වා කතං. තං හි චතූහි පාදෙහි තීහි අපස්සයෙහි ච යුත්තත්තා සත්තඞ්ගපීඨනති වුත්තං. හද්දපීඨනති වෙත්තමයපීඨං වුච්චති. පීඨිකාති පිලොතිකං බන්ධිත්වා කතපීඨමෙව. එළකපාද පීඨං නාම දාරුපට්ටිකාය උපරි පාදෙ ඨපෙත්වා හොජනපලලඩකං විය කතපීඨං වුච්චති. ආමලකවට්ටිකපීඨනති උභයෙනාපි ආම ලකාකාරෙන යොජිතං බහුපාදපීඨං වුච්චති. කොච්ඡං නාම උසීර මයං වා වාකමයං වා මුඤ්ජමයං වා අනෙතා පවෙසෙත්වා බද්ධං හොතීති දස්සිතං. පලාලපීඨනති තිසජ්ජත්වාය කතා පලාලහිසි."

විනයවිනිච්ඡය ටීකා.

ඝට්ටනඵලක නම් යම් පුවරුවෙක්හි සිවුර තබා අතින් ගවත් නම් ඒ පුවරුව යි. ඝට්ටනමුග්ගරය නම් නුවා ආදිය ගවන මුගුර ය යි කියත්. දණ්ඩමුග්ගරය නම් පඬු පෙවූ සිවුර තළන මුගුර යි. පඬු ගැසූ සිවුර මට්ටම් වූ එක් මුගුරක වෙළා මට්ටම් වූ එක් පුවරුවක් මතුයෙහි තබා මට්ටම් වූ අනෙක් පුව රුවකින් වසා එක් අයෙක් ඒ වැසූ පුවරුව මතුයෙහි නැගී සිටියි. දෙදෙනෙක් ඒ මත්තෙහි වූ පුවරුව දෙකෙළවරින් අල්වා ගෙණ එහාට මෙහාට අදිත්. අත්හි තබ්බවා අතින් මැඩීම වනාහි පඬු ගසා නිම වූ සිවුර තෙතපිටින් තිබිය දී ම කටයුතු යි. මේ ඝට්ටන ඵලක ඝට්ටනමුග්ගරයන්ගෙන් කරණ මැඩීම වියලුනු කල්හි සිවුරේ තද ගතිය නැති වනු පිණිසය යි දතයුතු යි. අම්මණ නම් පුවරු (= ලෑලි) වලින් පොකුණක් මෙන් කරණලද පානීයභාජන ය යි.

" සඞ්ඛථාලකං පන භාජනීයං. තථා දාරුමයො උදකතුම්බො. පාදකථලිකං මණ්ඩලං දාරුමයං වා හොතු චොළපණ්ණාදිමයං වා සබ්බං ගරුභණ්ඩං. ආධාරකො, පත්තපිධානං, තාලවණ්ටං, විජනී, චඞ්ගොටකං, පච්ඡි, යට්ඨිසම්මුඤ්ජනී, මුට්ඨිසම්මුඤ්ජනීති එතෙසුපි යං කිඤ්චි ඛුද්දකං වා මහන්තං වා දාරුවෙළුපණ්ණචම්මාදීසු යෙන කෙනචි කතං ගරුභණ්ඩමෙව. ථම්භතුලාසොපානඵලකාදීසු යං කිඤ්චි දාරුමයං වා පාසාණමයං වා ගෙහසම්භාරූපගං යො කොචි කටසාරකො යං කිඤ්චි භුම්මත්ථරණං වා යං කිඤ්චි අකප්පියචම්මං සබ්බං සඞ්ඝිකං ගරුභණ්ඩං. භුම්මත්ථරණං කාතුං වට්ටති. එළකචම්මං පන පච්චත්ථරණගතිකං හොති. තම්පි ගරුභණ්ඩමෙව. කප්පියචම්මානි භාජනීයානි. කුරුන්දියං පන සබ්බං මඤ්චප්පමාණං චම්මං ගරුභණ්ඩන්ති වුත්තං. "

කඞ්ඛාවිතරණී - සමන්තපාසාදිකා.

" අකප්පියචම්මන්ති සීහාදීනං චම්මං. භුම්මත්ථරණං කාතුං වට්ටතීති ඉදං අකප්පියචම්මං සන්ධාය වුත්තං. පච්චත්ථරණගතිකන්ති ඉමිනා මඤ්චපීඨෙ හි අත්ථරිතුං වට්ටතීති දීපෙති. පාවාරාදි පච්චත්ථරණම්පි ගරුභණ්ඩන්ති එකෙ. නොති අපරෙ. වීමංසිත්වා ගහෙතබ්බං. කප්පියචම්මානීති මිගාදීනං චම්මානි. "

විනයත්ථමඤ්ජූසා.

" කප්පියචම්මන්ති එළකාජමිගානන්ති ආදිනා හෙට්ඨා දස්සිතං කප්පියචම්මං. තබ්බිපරීතං අකප්පියං අභාජියං ගරුභණ්ඩත්තා. භුම්මත්ථරණං කත්වා පරිභුඤ්ජිතුං වට්ටති. පමාණයුත්තො මඤ්චො නාම යස්ස දීඝතො නවවිදත්ථියො තිරියං තදුපඩ්ඪං. "

විනයවිනිච්ඡයටීකා.

" වෙළුම්හි භාජියා තෙලනාළි කත්තරදණ්ඩකො,
ඡත්තදණ්ඩසලාකායො තතොපාහනදණ්ඩකො.

අනුඤ්ඤාතවාසිදණ්ඩො කරණ්ඩො පාදගණ්ඨකො,
අරණඤ්ජනිසිඞ්ගාදි භික්ඛූපකරණං තථා,
තච්ඡිතානිට්ඨිතං දාරුභණ්ඩං දන්තඤ්ච භාජියං.

භික්ඛූපකරණෙ පාදඝටකො මත්තිකාමයො,
භාජියං කප්පියං චම්මං තෙලචම්මමභාජියං. "

ඛුද්දසික්ඛා.

" වෙළුම්හීති 'ආදිනා දාරුභණ්ඩානි දස්සෙති. දාරුභණ්ඩන්ති පන සඞ්ගහෙත්වා සබ්බාපි දාරුවෙළුචම්මූපාහනාදි විකති වෙදිතබ්බා. ඡත්තදණ්ඩො ච සලාකා චාති චයො. උපාහනාය දණ්ඩකො = උපාහනදණ්ඩකො.

යථාවුත්තතො අඤ්ඤං දරුභණ්ඩෙසු ගරුභණ්ඩං. මත්තිකාමයො පාදඝටකො භාජියොති යොජනා. පාදඝටකොති පාදස්ස පහොනකො ඝටකො. ඝටකොති ඉමිනා මත්තිකාභණ්ඩං උපලක්ඛෙති. තස්මා පත්තො ථාලකං කුණ්ඩිකාති ඉමානි භාජනීයානි. වුත්තාවසෙසා අභාජියා. ”

බුද්ධසික්ඛාටීකා.

“ වෙළුමහි = වෙළුයෙහි; තෙලනාළි – තෙල්නැළි; භාජියා – බෙදිය යුත්තී ය; කත්තරදණ්ඩකො – සැරයටිය ද; ඡත්තදණ්ඩසලාකායො – සැත්දඬු හා ගොනැස් ද; උපාහනදණ්ඩකො – වහන් කොක්ක ද; තථා – එසේ මැ යි.

අනුඤ්ඤාතවාසිදණ්ඩො – (කරවියල්ලෙහි ලා පරිහරණ කට හැකි) අනුදත් වෑයෙහි දණ්ඩ ද; පාදගණ්හකො – පාදයක් තෙල් ගන්නා; කරණ්ඩො – කරඬුව ද; අරණඤ්ජනිසිඞ්ගාදි – අරණිභාණ්ඩ අඳුන්නල තෙල්හං ආදි වූ; භික්ඛුපකරණං – මහණ පිරිකර ද; තථා – එසේ ම (බෙදිය යුත්තේ ය.) තචජිතානිට්ඨිතං – සැස නො නිමතල ද; දරුභණ්ඩං – දරුභාණ්ඩ ද; දන්තඤ්ච – (නො සැසි හෝ කොට නො නිමි හෝ) දළ ද; භාජියං – බෙදිය යුත්තේ යි.

භික්ඛුපකරණෙ – මහණ පිරිකරෙහි; මත්තිකාමයො – මැටි මුවා වූ; පාදඝටකො – පාදයක් තෙල් ගන්නා කළ ය (බෙදිය යුත් තේ ය.) කප්පියං චම්මං – කැප සම්; භාජියං – බෙදිය යුත්තේ ය. තෙලචම්මං – තෙලිසම්; අභාජියං – නො බෙදිය යුත්තේ ය. ”

කුදුසික සන්න.

“ ගරුනා ගරුභණ්ඩඤ්ච – ථාවරං ථාවරෙන ච,
ථාවරං පරිවත්තෙය්‍ය – තථා කත්වා ච භුඤ්ජතු,
වල්ලාදිං ඵාතිකම්මෙන – ගණ්හෙ සෙසමභාජිය ” න්ති.

බුද්දසික්ඛා.

“ ගරුනා ගරුභණ්ඩඤ්ච ථාවරඤ්ච පරිවත්තෙය්‍ය. ථාවරෙන ච ථාවරම්පි පරිවත්තෙය්‍යාති යොජෙතබ්බං. ගරුනාති ගරුනා මඤ්චපීඨාදිනා; ථාවරන්ති ආරාමාදි; පඨමරාසිචයං තථා කත්වා ච භුඤ්ජතූති එවඤ්ච පරිවත්තෙත්වා තතො ආහතං කප්පියභණ්ඩං පරිභුඤ්ජෙය්‍යාති අත්ථො. විධිම්හි අයං තුංපච්චයො. ඵාතිකම්මෙන වල්ලාදිං ගණ්හෙති සම්බන්ධනීයං. සෙසන්ති පඨමරාසිතිකන්ති. ”

බුද්දසික්ඛා ටීකා.

“ ගරුනා – (මඤ්චපීඨාදි) ගරුභාණ්ඩයෙන්; ගරුභණ්ඩඤ්ච – (මඤ්චපීඨාදි) ගරුභාණ්ඩ ද; ථාවරඤ්ච – (ආරාමාදි) ථාවරය ද; පරිවත්තෙය්‍ය – පෙරළි කරන්නේ ය. ථාවරෙන ච – (ආරාමාදි) ථාවරයෙන් වනාහි; ථාවරං – (ආරාමාදි) ථාවරය ම (පෙරළි කරන්

නේ ය.) තථා කත්වා ච – එසේ පෙරළි කොට ද (ලද කැප පසය); භුඤ්ජතු – වළඳුවා. වල්ලාදිං – වැල් හුණු ආදි; ඵාතිකම්මෙන – වැඩිකමින්; ගණ්හ – ගන්නේ ය. සෙසං – ආරාමාදි සෙස්ස; අභාජියං – නො බෙදිය යුත්තේ යි.

ඵාතිකම්මං නාම සමකං වා අතිරෙකං වා තදග්ඝනකං – ඒ වටනා මිල හෝ වඩා දීම හෝ ඵාතිකම් නමි.”

ඛුදුසික සන්න.

“උදුක්ඛලං මුසලං සුප්පං නිසදං නිසදපොතො පාසාණදොණි පාසාණකටාහං තුරිවෙමභස්තාදිසබ්බං පෙසකාරාදිභණ්ඩං සබ්බං කසිභණ්ඩං සබ්බං චක්කයුත්තයානං ගරුභණ්ඩමෙව.”

සමන්තපාසාදිකා.

“නිසදෙන පාසාණකටාහඤ්ච සඞ්ගහිතං. චක්කයුත්තයානන්ති හත්ථවට්ටකසකටාදි චක්කයුත්තයානඤ්ච.”

විනයවිනිච්ඡය ටීකා.

“සබ්බං චක්කයුත්තයානන්ති රථසකටාදිකං සබ්බං චක්කයානං. විසඞ්ඛතචක්කං පන යානං භාජනීයං.”

විනයසඞ්ගහඅත්ථවණ්ණනා.

“මඤ්චපීඨානං පාදා ච අටනියො ච වාසිඵරසුආදීනං දණ්ඩාති වෙති එතෙසු යං කිඤ්චි අනිට්ඨිතං භාජනීයං. තච්ඡිතමට්ඨං පන ගරුභණ්ඩං හොති. අනුඤ්ඤාතවාසියා දණ්ඩො ඡත්තං මුට්ඨිපණ්ණං කත්තරයට්ඨි උපාහනදණ්ඩකො අරණිසහිතං ධම්මකරකො පාදගණ්හනකතො අනතිරිත්තං ආමලකතුම්බං ආමලකඝටො ලාබුතුම්බං ලාබුඝටො විසාණකතුම්බන්ති සබ්බමෙතං භාජනීයං. තතො පරං ගරුභණ්ඩං. හත්ථිදන්තො වා යං කිඤ්චි විසාණං වා අතච්ඡිතං යථාගතමෙව භාජනීයං. තෙහි කතමඤ්චපාදාදීසු පුරිම සදිසොව විනිච්ඡයො. තච්ඡිතනිට්ඨිතොපි හිඞ්ගුකරණ්ඩකො අඤ්ජනීකරණ්ඩකො ගණ්ඨිකා වීධො අඤ්ජනී අඤ්ජනිසලාකා උදකපුඤ්ඡනීති ඉදං සබ්බං භාජනීයමෙව.”

කඞ්ඛාවිතරණී – සමන්තපාසාදිකා.

“අනුඤ්ඤාතවාසි නාම යා සිපාටිකාය පක්ඛිපිත්වා පරිහරිතුං සක්කාති වුත්තා. මුට්ඨිපණ්ණන්ති තාලපත්තං. තං හි මුට්ඨිනා ගහෙත්වා පරිහරන්තීති මුට්ඨිපණ්ණන්ති වුච්චති. මුට්ඨිපණ්ණන්ති ඡත්තච්ඡදනපණ්ණමෙවාති කෙචි. අරණිසහිතන්ති අරණියුගලං; උත්තරාරණී අධරාරණීති අරණිවයන්ති අත්ථො.”

විනයත්ථමඤ්ජූසා.

“එතෙසු යං කිඤ්චි විප්පකතතච්ඡනකම්මං අනිට්ඨිතං තෙ සබ්බෙ භාජනියා. තමඤ්ඤං ගරුභණ්ඩං හොතීති. ඡත්තන්ති පණ්ණකිලඤ්ජසෙතච්ඡත්තවසෙන තිවිධඡත්තං.”

විනයවිනිච්ඡය ටීකා

"උදුක්ඛලං – වන; මුසලං – මොහොල; සුප්පං, කුල්ල; නිසදො – දගල; නිසදපොතකො – දපොය (= අත්ගල); පාසාණදොණි – ගල්දෙණ; පාසාණකටාහං – ගලින් කපා කරණලද තාලි යි. සබ්බං කාසිභණ්ඩං – කඟුල් වියදඹු ආදි වූ සියලු කෘෂි භාණ්ඩ; චක්කසුත්තං – සක් යෙදූ; සබ්බං යානං – සියලු යාන ද; මඤ්චපීඨානං පාදා ච – මඤ්චපීඨයන්ගේ පාදයෝ ද; අටනියො ච – හැඳ වල් ද; වාසිඵරසුආදීනං දණ්ඩානි වෙති – වෑ පොරෝ ආදීන්ගේ දඬු ද යන; එතෙසු – මොවුන් කෙරෙහි ලා; යං කිඤ්චි අනිට්ඨිතං – සැසැ නො නිමවනලද යම් කිසිවෙක් ඇද්ද; තං – ඒ; භාජනීයං – භාජනීය යි. තචජ්ජිතමට්ඨං පන – සැසැ මට කරණ ලද්දේ වනාහි; ගරුභණ්ඩං හොති – ගරුභාණ්ඩ වේ. අනුඤ්ඤාත වාසියා දණ්ඩො – යම් වාසියක් තොමෝ කරවියල්ලෙහි ලා පරිහරණය කරන්නට පිළිවන් ද හෝ තොමෝ අනුඤ්ඤාතවාසි නම් වේ. එසේ වූ වාසියගේ දඬ ද; ඡත්තං – පණ්ණතාලාදි වූ ඡත්‍ර ද; මුට්ඨිපණ්ණං – මිටි තලපත ද; කත්තරයට්ඨි – සැරයටිය ද; උපාහනදණ්ඩකො – වාන්කොක්ක ද; අරණීසහිතං – මෝල සහිත වූ ගිනිදඬ ද; ධම්මකරණො – ඩබරාව ද; පාදගණ්හනකතො – දිය පස්නැළියක් ගන්නෙන්; අනතිරිත්තං – මහත් නො වන්නා වූ; ආමලකතුම්බං – ඇඹුලු කල්කයෙන් කරණලද පද්ද ද; ආමලකඝටො – එසේ මැ ඇඹුලුයෙන් කරණලද කළය ද; ලාබුකතුම්බං – ලබුපකින් කරණලද පද්ද ද; ලාබුඝටො – ලබු පැහය ද; විසාණකතුම්බං – ගවරඟං ආදීන් කරණලද පද්ද ද; තතො පරං – එයින් අන්‍ය යටැ අප කියනලද දෙයින් සෙස්ස; යථා හනමෙව – ගෙණ ආ පරිද්දෙන් මැ; හිංගුකරණ්ඩකො – සුඟු කරඬුව; අඤ්ජනකරණ්ඩකො – අඳුන්කරඬුව; ගණ්ඨිකා – සඟළ සිවුරේ ඔබන ගැට; විධො – පටි මුවවිට සිටිනා වියඨ ද; අඤ්ජනී – අඳුන්නල ද; අඤ්ජනිසලාකා – අඳුන් ලා ද; උදකපුඤ්ඡනී – දිය පිස්නා ලැල්ල ද;"

කඞ්ඛාවිතරණී පිටපොත,

"රජනදෙණී නාම යත්ථ චීවරං රජන්ති පක්කරජනං වා ආකිරන්ති. මඤ්ජූසා නාම දෙණී පෙලා වා."

විනයවිනිච්ඡය ටීකා,

"තාලවණ්ටන්ති තාලවණ්ණෙහි කතං. වෙළුදන්තවලලීහි වා මොරපිඤ්ජෙහි වා චම්මවිකතීහි වා කතං තාලවණ්ටන්තෙව වුච්චති. බීජනීති චතුරස්සවිධූපනඤ්ච. කෙතකපාරොහකුන්දල පණ්ණාදිමයා විසාණමයාදිදණ්ඩකාපි."

විනයවිනිච්ඡය ටීකා,

"නාලිකෙරහීරාදීහි බද්ධා යට්ඨිසම්මුඤ්ජනී. ඛජ්ජූරිනාලිකෙර පණ්ණාදීහි බද්ධා ගෙහසම්මුඤ්ජනී."

විනයවිනිච්ඡය ටීකා.

පොල්ඉරටු ආදීන් බඳනා ලද්දේ ඉරටු මුස්න යි. ඉදිකොළ පොල්කොළ ආදීන් බඳනාලද්දේ ගේ අමදින මුස්න යි.

"භුම්මත්ථරණං කාතුං වට්ටතීති අකප්පියචම්මං සන්ධාය වුත්තං. පච්චත්ථරණගතිකත්තාති ඉමිනා මඤ්චපීඨෙ අත්ථරිතුං වට්ටතීති දීපෙති. පාවාරාදිපච්චත්ථරණම්පි ගරුභණ්ඩන්ති එකෙ වදන්ති. වීමංසිත්වා ගහෙතබ්බං."

සාරත්ථදීපනී.

25. මත්තිකාභණ්ඩ.

"මත්තිකාභණ්ඩෙ සබ්බං මනුස්සානං උපභොගපරිභොගං ඝටපිඨරාදිකුලාලභාජනං පත්තකටාහං අඞ්ගාරකටාහං ධූමදානකං දීපරුක්ඛකො දීපකපල්ලිකා චයනිට්ඨිකා ඡදනිට්ඨිකා ථූපිකාති සබ්බං ගරුභණ්ඩං."

කඞ්ඛාවිතරණී – සමන්තපාසාදිකා.

"පත්තකටාහන්ති පත්තපචනකටාහං."

විනයාලඞ්කාර – විමතිවිනොදනී.

"ධූමදානකන්ති ධූමනාලිකා. පාකාරචෙතියාදීනං චයනිට්ඨිකා. ථූපිකාති පාසාදාදිථූපිකා."

විනයවිනිච්ඡය ටීකා.

"මනුස්සානං – මනුෂ්‍යයන්ට; ඝට – කළය ද; පිඨරාදි – මහ සැළ ආදිය; පිඨර නම් පුසන්දඬු ලන බඳන යනාදි වූ; කුලාල භාජනං – කුඹල්වලඳ; පත්තකටාහං – පාත්‍ර පිසන කබල් ද; අඞ්ගාරකටාහං – වක් ගිනි කබල් ද; ධූමදානං – දුම් දෙන්නාවූ නල ද; දීපරුක්ඛකො – පාන්තඳ; දීපකපල්ලිකා – පහන් කබල් ද; චයනිට්ඨිකා – ගඩුළු ද; ඡදනිට්ඨිකා – පතුළු ද; ථූපිකාති – කොත ද යන මේ; සබ්බං – සියල්ල;"

කඞ්ඛාවිතරණී පිටපොත.

"එතෙසු පන වුත්තනයෙසු ගරුභණ්ඩෙසු යං කිඤ්චි වෙළු ආදි අත්තනො අත්ථාය ගණ්හන්තෙන සමකං වා අතිරෙකං වා ඵාතිකම්මං කත්වා ගහෙතබ්බං. පාදගණ්හනකතො අනතිරිත්තප්පමාණො පන ඝටකො පත්තං ථාලකං කඤ්චනකො කුණ්ඩිකාති ඉදමෙත්ථ භාජනීයං. යථා ච මත්තිකාභණ්ඩෙ එවං ලොහභණ්ඩෙපි. කුණ්ඩිකා භාජනීයකොට්ඨාසමෙව භජති."

කඞ්ඛාවිතරණී.

"ඵාතිකම්මං කත්වාති අන්තමසො තං අග්ඝනකං වෙළුකායපි ථාවරං වඩ්ඪකිකම්මං කත්වා. ඵාතිකම්මං කත්වා අගණ්හන්තෙන තත්ථෙව වලඤ්ජෙතබ්බො. ගමනකාලෙ සඞ්ඝිකෙ ආවාසෙ ඨපෙත්වා

ගන්තබ්බං. අසතියා ගහෙත්වා ගතෙන පහිණිත්වා දාතබ්බො. දෙස
න්තරං ගතෙන සම්පත්තවිහාරෙ සඞ්ඝිකාවාසෙ ඨපෙතබ්බො.
එත්ථාති මත්තිකාභණ්ඩෙ. කුණ්ඩිකාති අයකුණ්ඩිකා චෙව තම්බ
ලොහකුණ්ඩිකා ච. භාජනීයකොට්ඨාසමෙව භජතීති භාජනීය
පක්ඛමෙව සෙවති. න තු ගරුභණ්ඩන්ති අත්ථො. කඤ්චනකො
පන ගරුභණ්ඩමෙවාති අධිප්පායො. ඉතරන්ති ගරුභණ්ඩං. ”

විනයත්ථමඤ්ජූසා.

“ කඤ්චනකොති කාරකො. ”

විනයවිනිච්ඡය ටීකා.

“ **ඵාතිකම්මං කත්වා** – වෘද්ධිකම් කොට; **ගහෙතබ්බං** – ගත
යුත්තේ යි. **කඤ්චනකො** – කොතලය; **ඉදමෙත්ථ භාජනීයං.
එත්ථ** – මේ මත්තිකාභාණ්ඩයෙහි ලා; **ඉදං භාජනීයං** – මේ බෙදිය
යුතු දෑ යි. **යථා ච මත්තිකාභණ්ඩෙ** – මත්තිකාභාණ්ඩයෙහි ලා
කුණ්ඩිකා තොමෝ; **යථා භාජනීයං** – යම් සේ භාජනීය ද; **එවං** –
එපරිද්දෙන්; **ලොහභණ්ඩෙ** – ලොහභාණ්ඩයෙහි; **කුණ්ඩිකා** –
කුණ්ඩිකා තොමෝ; **භාජනීයකොට්ඨාසමෙව භජති** – භාජනීය
කොට්ඨාසය මැ සෙවුනි. ”

කඞ්ඛාවිතරණී පිටපොත.

ගරුභණ්ඩ මූලච්ඡෙද්‍ය වශයෙන් අවිස්සජ්ජිය අවෙභඞ්ගිය බව
හා පරිවර්තනය කරන්නහුට අනාපත්ති බව මෙහි මුලින් දක්වන
ලදි. එහි පරිවර්තන ක්‍රමය මෙතැන් පටන් දක්වනු ලැබේ. මෙහි
පඤ්චවිධ ගරුභණ්ඩ ම චීවර පිණ්ඩපාත හා බෙහෙත් පිණිස පවරා
දෙන්නට නො වටනේ ය. ස්ථාවර භාණ්ඩයක් ස්ථාවර භාණ්ඩ
යක් සමග ද ගරුභාණ්ඩයක් ගරුභාණ්ඩයක් සමග ද මාරු කරන්
නට වටනේ ය. ස්ථාවර වස්තු අතුරෙහි කෙත් ය, වතු ය, විල් ය,
ඇළ ය යන මෙබඳු දෙය භික්ෂුසඞ්ඝයා විසින් සොයා බලන්නට හෝ
පිළිගන්නට හෝ ඉවසන්නට හෝ නො වටී. කැපකරුවන්
විසින් ම විචාරිත දෙයින් පිළියෙළ වූ කැපබඩු වටී. ආරාමයක්
සමග ආරාමය ආරාමවත්තය යන දෙක ද, විහාරයක් සමග
විහාරය, විහාර වත්ත ය යන දෙක දු යි යන මේ සතර ම මාරු
කරන්නට වටී.

එහි මේ කියනු ලබන්නේ පරිවර්තනක්‍රමය යි. සඞ්ඝයාගේ
පොල්වත්තක් දුර පෙදෙසෙක්හි වෙයි. කැපකරුවෝ එයින්
වැඩි හරියක් කති. නො කා ඉතිරි වූ මඳ දෙයින් ද කරත්ත කුලී
ආදිය දී ඉතා සවල්පයක් ම සඞ්ඝයාට ගෙණවුත් දෙති. ඒ පොල්
වත්තට නුදුරු ගම්හි වැසි මිනිසුන්ගේ පොල්වත්තක් විහාර සමීප
යෙහි වෙයි. ඒ මිනිස්සු සඞ්ඝයාවහන්සේ වෙත එළඹ පොල්වතු

දෙන මාරු කරන්නට සාවඥු කෙරෙති. එකල්හි සඞ්ඝයා විසින් "සඞ්ඝයාට රිසි වේ ය" යි අපලොකනය කරමා පිළිගත යුතු යි. භික්ෂූන්ගේ වත්තෙහි පොල් ගස් දහසක් වුවත් මිනිසුන්ගේ වත් තෙහි ගස් පන්සියයක් වුවත් "තොපගේ පොල් වත්ත කුඩා නො වේ ද" යි නො කිය යුතු යි. මක්නිසා ද? ගස් දහසක් ඇති වත් තෙන් කැපකරුවන්ගෙන් ලැබෙන ආදායම ගස් පන්සියයක් ඇති වත්තෙන් ලැබෙන පමණට වඩා වැඩි නො වන බැවිනි. සම ආදායමක් ලැබෙතත් කැමැති කැමැති අවස්ථාවෙක්හි ප්‍රයොජන ගත හැකි නිසා විහාර සමීපයෙහි වූ ඉඩම කුඩා වුව ද පිළිගන් නට වටනේ ම ය. එහෙත් මිනිසුන්ගේ ඉඩමෙහි ගස් බොහෝ නම් "තොපගේ ඉඩමෙහි සඞ්ඝයාගේ ඉඩමෙහි තිබෙන පමණට වඩා ගස් ඇත්තේ නො වේ ද" යි කිය යුතු යි. වත්ත හිමියන් තමන්ගේ වත්තේ වටිනාකම නොදන දෙන කල්හි, ඒ බව දන සොරසිතින් ගන්නහුට අවහාරය වේ ය යි දක්වනු පිණිස එසේ කියනලදී. "වැඩි කොටස අපට පින් පිණිස වේවා, අපි සඞ්ඝයාට දෙමහ" යි කී කල්හි පිළිගන්නට වටී. භික්ෂූන්ගේ ඉඩමේ ගස් පිදී පල දරණ කල්හි මිනිසුන්ගේ ගස් පල නො දරතත් ලඟ දී පල දරන්නේ නො වේ ද" යි පිළිගත යුතු ම ය. මිනිසුන්ගේ ඉඩමෙහි ගස් පල දරණ කල්හි භික්ෂූන්ගේ ඉඩමෙහි ගස් තව ම පිදී නැත් නම් "තොපගේ ඉඩමෙහි ගස් පල දරණවා නො වේ ද යි" මිනිසුන්ට කිය යුතු යි. "ස්වාමීන්වහන්ස, පිළිගත මැනව. අපට පින් සිද්ද නො වේ ද" යි කියත් නම් පිළිගන්නට වටී. මේ දක් වූයේ ආරාමයක්, ආරාමයක් හා හුවමාරු කර ගත යුතු ක්‍රමය යි. මේ ක්‍රමයෙන් ම ආරාමවත්ථුව ද, විහාරය ද, විහාරවත්ථුව ද ආරා මය හා මාරු කළ යුතු යි.

විහාරයක් සමග විහාරයක් කෙසේ හුවමාරු කර ගත යුතු ද? ඇතුළුගම සඞ්ඝයා සන්තක වූ ගෙයක් වෙයි. විහාරමධ්‍යයෙහි මිනිසුන්ගේ ප්‍රාසාදයක් වෙයි. දෙක වටිනාකමින් සම යි. මිනිස්සු "ඒ ප්‍රාසාදය රැගෙණ සඞ්ඝසන්තක වූ ගෙය දුන මැනවැ" යි යාවඥු කෙරෙත් නම් මාරු කරන්නට වටනේ ය. සඞ්ඝයා අයත් ගෙය වඩා අගනා එකක් නම් "අපගේ ගෙය බොහෝ අගනේ නො වේ ද" යි කී කල්හි "එය අගනා බව නම් සැබෑ ය. එහෙත් පැවිද්දන්ගේ වාසයට නො සරුප් ය. එහෙයින් ස්වාමීන්වහන්සේ ලාට එහි වසන්නට නො හැක. මෙය වනාහි හැම අතින් ම සරුප් වෙයි. එහෙයින් පිළිගත මැනවැ" යි කියත් නම් පිළිගන්නට වටී. මිනිසුන්ගේ ගෙය වඩා අගනේ නම් "තොපගේ ගෙය වඩා

අගනේ නො වේ ද" යි කියයුතු යි. "ස්වාමීන්වහන්ස, එයට කාරණ යක් නැත. වැඩි කොටස අපට පින් පිණිස වන්නේ ය. පිළිගත මැනවැ" යි කියත් නම් පිළිගන්නට වටී.

ගරුබඩුවක් සමග ගරුබඩුවක් මාරු කිරීමෙහි විනිශ්චය මෙසේ දත යුතු යි. ඇඳක් හෝ පුටුවක් මහත් හෝ වේවා, කුඩා හෝ වේවා, යටත් පිරිසෙයින් වැලිකෙළියෙහි නියුක්ත ගම්දරු වන් විසින් කරණලද සතරඟුල් පමණ පා ඇති ඇඳ හෝ පුටුව ද සඞ්ඝයාට දෙනලද තැන් පටන් ගරුභාණ්ඩ වේ. ඉදින් රාජ - රාජමහාමාත්‍රාදීහු එක්වර ම ඇඳන් සියයක් හෝ දහසක් හෝ දෙත් නමුදු කප්පියමඤ්චයෝ වෙත් නම් ඒ සියල්ල පිළිගත යුතු ය.

'කප්පියමඤ්චයෝ පිළිගත යුත්තාහු ය' යනු 'සඞ්ඝයාට දෙම්හ' යි කියා දෙනලද්ද සඳහා කියනලදී. ඉදින් වනාහි 'විහාර යට දෙම්හ' යි කියද්ද එකල්හි රන් රිදී ආදියෙන් කළ නො කැප හැඳන් ද පිළිගන්නට වටී.

පිළිගෙණ වෘද්ධපරිපාටීන් 'සඞ්ඝිකපරිභොගයෙන් පරිභොග කරණු මැනවැ' යි දියයුත්තාහ. පෞද්ගලිකවශයෙන් වනාහි නො දියයුත්තාහ. දී ඉතිරි ඇඳන් භාණ්ඩාගාරාදියෙහි පණවා පාත්‍රචීවර බහා තබන්නටත් වටනේ ය. සීමාවෙන් පිටත දී 'සඞ්ඝ යාට දෙම්හ' යි දෙනලද හැඳ සඞ්ඝස්ථවිරයන්වහන්සේ වසන තැනට දියයුතු යි. ඉදින් එහි බොහෝ මඤ්චයෝ වෙත් නම්, අනෙක් හැඳකින් ප්‍රයොජනයෙක් නැත් නම්, යම් තෙරුන්වහන් සේ නමක් වසන තැනකට ප්‍රයොජන වේ නම්, 'සඞ්ඝික පරි භොගයෙන් පරිභොග කළ මැනවැ' යි එතැනට දිය යුතු යි. මා හැඟි වූ සියයක් අගනා හෝ දහසක් අගනා හෝ ලක්ෂයක් අගනා හෝ හැඳකින් වෙත හැඳන් සියයක් ලැබේ නම් එසේ මාරු කොට ගත යුතු යි. හුදෙක් හැඳක් සමග මාරු කළ යුත්තේ හැඳක් පම ණක් ම නො වේ. ආරාම - ආරාමවත්ථු - විහාර - විහාරවත්ථු - පීඨ - භිසි - බිම්බොහනයන් ද මාරු කරන්නට වටී. පීඨ - භිසි - බිම්බො හනයන් කෙරෙහි දු මෙ ම ක්‍රමය යි. (එනම්, පීඨ - භිසි - බිම්බො හනයන් සමග පීඨ - භිසි - බිම්බොහනයන් පමණක් නො ව විහාර - විහාරවත්ථු ආදිය ද මාරු කරන්නට වටී.) මොවුන්ගේ කැප නො කැප බව මුලින් දක්වූ පරිදි ම දත යුතු යි. එහි නො කැප බඩු පරිභොග නො කටයුතු යි. කැප බඩු සඞ්ඝිකපරිභොගයෙන් පරිභොග කටයුතු යි. අකප්පිය මඤ්චාදිය හෝ කප්පිය මහග්ඝ මඤ්චාදිය හෝ මාරු කොට, කියනලද පරිදි අන්‍ය මඤ්චාදිය ගත යුතු යි.

නො කැප වු හෝ බොහෝ අගනා කැප වූ හෝ භාණ්ඩය යන මෙහි නො කැප නම් සවණ්ණාදීන් කළ මඤ්චාදිය හා නො කැප වූ භිසි – බිම්බොහනයෝ සි. බොහෝ අගනා කැපබඩු නම් ඇත් දළින් කළ මඤ්චාදිය හා කොඳුපලස් ආදි කැපඇතිරිලි ආදිය සි.

කලුකොඳයාවේ පඤ්ඤාසේඛර ස්ථවිරයන් විසින්
නිවන් සුව පතා, සබ්‍රම්සරුන්වහන්සේට පරිත්‍යාග
කිරීම පිණිස ලියනලද ගරුභාණ්ඩවිනිච්ඡය
සමාප්ත සි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු